# SUBHASITA

BY

Alagiyawanna Mohottala,

PARAPHRASED BY

## R. W. DIAS.

අලගියවන්න මොහොට්ටාල

නමැති

පණ්ඩිතොත්තමයා

විසින්

කවිකරන ලද

# සුභාෂිතය.

EDITED BY

W. P. Ranasingha,

PROCTOR, SUP. COURT

PRINTED AND PUBLISHED BY

G. H. PERERA.

DINAKARA PRAKASA PRESS

1900

# දැන්වීමයි.

---

අප විසින් පළමුවෙනි වතාවේ අච්චුගස්වන ලද මෙම පොත පාඨශාලාවල ඉගෙණගන්නා ශිෂ්‍යයන්ට සහ අවශෙෂ ජනයාටත් බොහෝ ප්‍රයොජනවත්වූ බැවින් නැවතත් දෙවෙනිවරට අච්චුගස්වා ප්‍රසිද්ධ කෙළෙමු.

G. H. P.

1893 දෙසැම්බර් මස
14 වෙනි දිනදීය.

---

දෙවෙනිවර අච්චුගස්වන ලද පොතද දැනට ලබාගන්ට නොහැකි බැවින් බොහෝදෙනාගේ ඉල්ලීම පිට තුන්වෙනිවරටත් අච්චුගස්වා ප්‍රසිද්ධකළ බැව් සැලකිය යුතුයි.

G. H. P.

වර්ෂ 1900 ක්වූ දෙසැම්බර් මස
20 වෙනි දින කොළඹදීය.

# අලගියවන්න මොහොට්ටාල කිවිතුමා.

## THE POET ALAGIYAWANNA MOHOTTALA.

මෙතුමා ශ්‍රී රාජසිංහ මහරජානන් සීතාවක ප්‍රධාන නුවර කරගෙණ ලඞ්කාද්වීපයේ රජකල සමයේදී එම මහරජානන් යටතේ උතුම් ධානන්තරයක් දරමින් විසූ ගොවිකුලයේ වැදගත් මහතෙක් වන ධම්මධ්වජ පඬිතුමානන්ගේ පුත්‍රයෙකි, මෙම අලගියවන්න මොහොට්ටාල නම් කවීන්ද්‍රයා එළු, පාලි, සංස්කෘත, ද්‍රවිඩාදී භාෂා මනාවස් උගත් කාව්‍යශාස්ත්‍රයෙහි අද්විතීයයෙක් බව එතුමාගේ වැඩවලින් පෙනේ. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රම බාහු මහරජද, තොටගමුවේ ශ්‍රී රාහුල සාමි ආදී අති ප්‍රසිද්ධ කවිවරයන්ට සමානකල නොහැකි වෙතත් මෙම පඬිතුමාද ගරුකොට සැලකියයුතු ඉතා වැදගත් කාව්‍යකාරයෙක් බව නොකියාම බැරිය "අලගියවන්න මොහොට්ටාල අපේ රටේ ඉතා උතුම් කාව්‍යකාරයෙක් කොට සලකනලද්දේය" යි * ගෞරවාර්හ ජේම්ස් ද අල්විස් මැතිතුමා පවා ලියාතිබේ.

දෙවෙනි රාජසිංහ මහරජානන් † විසින් ප්‍රතිකාල්වරුන්ට පහරදී ලංකාවෙන් ඔවුන් නෙරපා ඕලන්දයට නානාපතින් පිටත්කර යවා එම රජ සමග කථා බස්කරගෙණ ලන්දේසින් මෙහි ගෙන්වා හිඳිසුම් පිට කොළඹ ගාල්ල ආදී පළාත් ඔවුන්ට බාරදුන්කල ලන්දේසින් විසින් රට බාරගැණීමේදී කිසි තෝම්බුවක් නොතිබුන බැවින් තෝම්බුවක් ලියාදෙන මෙන් රාජසිංහ මහරජානන්ගෙන් ලන්දේසි ආණ්ඩුව ඉල්ලා සිටියේය, එවිට තෝම්බුවක් සාදදීමේ වැදගත් ධානන්තරයට මෙම අලගියවන්න මොහොට්ටාල පඬිතුමා පත්කරණුලැබූ බවත් රාජසිංහ මහරජානන් විසින් එවකට සීතාවක පුරයේ කඩවුම අසල ගම් බිම් දී පත්කරණු ලැබූ බවත් පොත පතෙන් පෙණේ.

ක්‍රි. වර්ෂ 1610 දී මෙතුමා විසින් කුසජාතකය රචනාකරණලදී ඒ කාව්‍යයේ රසවත් බැව් ආදිය ගැණ යමක් අප විසින් මෙහි ප්‍රකාශ නොකලාට කුසජාතකය කියවූ සියල්ලෝදනාම දනිත්. එම කුසජාතක කාව්‍ය අවසානයේදී තම පියානන් ගැනද තමන් ගැනත් මෙසේ කියා තිබේ.

තෙවලා දම් සයු ර<br>
නැණ නැවින් දුටු පරතෙ ර<br>
හිස්වැල් ගම් පව ර<br>
දහම් දජ පඬි නදන ගරුත ර<br>
අලගිය වත්න න මි<br>
මුකවෙටි තුමා ගුණතු මි<br>
දකිනට සසර හි මි<br>
මෙ කුසදා කවි කළේ මනර මි

---

* Alagiawanna Mohottala is justly regarded as one of our greatest Poets.—JAS. ALWIS' Sidatsangara Page CCVII.

† ක්‍රි. ව. 1627 දී මේ රජ සිංහාසනාරූඪවූ බව සැලකිය යුතුයි. පළමුවෙනි රාජසිංහ රජ සිංහාසනාරූඪවූයේ ක්‍රි. ව. 1573 දේදී වියයුතු.

මෙසින් හැඟෙන්නේ අලගියවන්න මොහොට්ටාල කිවිතුමාගේ පියානන්වූ ධර්මධ්වජ උතුමාත් මහ උගතෙක් බවයි. *

ක්‍රි. වර්ෂ 1612 ගේදී සුභාෂිතය නම්පොත කරණලද්දේයයි ගෞරවාර්හ සත්දත් ජේම්ස් ද අල්විස් මැතිතුමා ලියා තිබේ. නීතිවෙම්පා ආදී දෙමළ පොත් වලද හිතොපදේශය, මොහමුද්ගරය, භාරත ආදී ග්‍රන්ථයන්හිද ප්‍රකාශිත නීති වාක්‍ය බොහොමයක් කාන්තීරසානුගත පරිදි කවියට නගා සුභාසිතයේ අන්තර්ගත කරතිබේ.

බෞද්ධ ලබ්ධිය භජනය කරමින් කියා තිබෙන ඇතැම් කවිවලට ක්‍රිස්තියානි භක්තිකයින්ට එකඟවෙන්ට නොහැකි නමුත් සාමාන්‍යයෙන් මේ පොතේ කීම් වලට සියලුදෙනාම එකඟවෙතැයි සිතමු. නීති ශාස්ත්‍රය පුහුණුකිරීම පිණිස මෙය හා අනටත් දියයුතු ඉතා වැදගත් කවි පොතක් බව කියමු.

අලගියවන්න කිවිතුමා විසින් මේ ඇර තවත් කරණලද පොත් නම් සැවුල් සන්දේශය, නීතිසාරය, මහ හටනය, ප්‍රංගිහටනය යනාදියයි.

සැවුල් සන්දේශයෙහි කාව්‍යද නානාවිධ අලංකාර මධුර ප්‍රාණාදීයෙන්ද යුක්තයි. එහි ස්වභාව ලෝකයාට සැකෙවින් පෙන්වාදීම පිණිස යමක සහිත කවි හතරක් සහ වාක්‍යයක්ද මෙහි පහත දක්වනුලැබේ.

“හ ර තු රු රා ජ   විලසින් යසැති හැමව   ර
නි සි ම නු රා ජ   කුලයෙන් පැවතෙන පව   ර
රු පු ප ර රා ජ   මත ගජ රජ කෙසර යු   ර
දි න ව ර රා ජ   සිහ නරනිඳු සඳ මෙපු   ර”

හරතුරු රජ විලසින්, ඊශ්වරයාගේ (මස්තකයෙහිවූ) චන්ද්‍රයා පරිද්දෙන් නොහොත් ඊශ්වරයාගේ චන්ද්‍රයාමෙන්; හැමවර, සියලුකාලයෙහි; යසැති, යශස් ඇත්තාවූ; පවර, උතුම්වූ; නිසිමනු රජකුලයෙන්, යෝග්‍යවූ මහාසම්මත රාජවංශයෙන්; පැවතෙන, ප්‍රවෘත්තව එන්නාවූ; රුපු, ශත්‍රුවූ; පරරජ, අන්‍යරජ නමැති; මතගජරජ, මත්ත හස්තිරාජයන්ට; කෙසර යුර, කේශර සිංහයෙකු බඳුවූ; වර, උතුම්වූ; රාජසිහ නරනිඳුසඳ, රාජසිංහ නරේන්ද්‍රොත්තම තෙම; මෙපුර, මේ (සීතාවක)පුරයෙහි; දින, ජයග්‍රහණයකරමින් හෙවත් සංග්‍රාමශීර්ෂයන්පවතිනිවා.

“තවද ත්‍රිපුරවරාධිශ්වර සමස්ත සාමන්ත භූපාල ශෝභිත මණිමෞලී මාලාලංකෘත ශ්‍රීපාද පද්ම වනතාප ශෝභිත ශ්‍රී රාජසිංහ මහාරජෝත්තමයාගේ කීර්තිප්‍රතාප ගුණවර්ණනාදේශයක් ශ්‍රවණයකර”

“ව ස ත   මෙරජ වෙත සරසවිය සිරිකා   ත
සැ ප ත   විඳෝ දුක් නොම තරමිනි දුසි   ත
ස ත ත   බඹසරම රැකියෙන් මිස සත   ත
ස ක ත්   ලෙ ස සොවින් කැලු නොම වේද ග   ත”

* ස්වප්නමාලය නම් කවි පොත සාදන ලද්දේ මෙම පඬිතුමා විසිනැයි කියති.

නධ්‍යාතම්පදමීශ්වරස්‍ය විධිවත් සංසාර විච්ඡිත්තයෙ
ස්වර්ගද්වාර කවාට පාටන පටුර්ධර්මෝපි නොපාර්ජිතඃ
නාරී පීන පයොධරොරු යුගලං ස්වප්නෙපි නාලිඞ්ගිතං
මාතුඃ කෙවලමෙව යෞවන වනච්ඡෙදෙ කුඨාරොපමාඃ.

මෙහි අර්ථය

(අමක්හු විසින්) සංසාර විච්ඡිත්තයෙ, සසර දුක් දුරලනු පිණිස; විධිවත්, විධිවූ පරිද්දෙන්; ඊශ්වරස්‍ය පදම්, ඊශ්වරයාගේ පදය; නධ්‍යාතම්, නොසිතන ලද්දේ නොවත් සිත්හී නොවඩන ලද්දේද; ස්වර්ගද්වාර කවාට පාටන පටුඃ, ස්වර්ගද්වාරයාගේ කවුළු (දොරපුවරු) පැළීමෙහි පොහොසත්වූ; ධර්මඃ අපි, (කුසල) ධර්මයෙකුදු; නොපාර්ජිතඃ, ඇසුරු නොකරණ ලද්දේද; නාරීපීන පයොධරොරු යුගලම්, ස්ත්‍රීන්ගේ මහත් පුන්පියයුරු යුවල; ස්වප්නෙ අපි, සිහිනයෙහිදු; නආලිංගිතම්, වැළඳ නොගන්නාලද්දේද (හෙතෙම) කෙවලම්, හුදක්; මාතුඃ, මවගේ; යෞවන වනච්ඡේදෙ, යොවුන් බැව් නමැති වනය සිඳීමෙහි; කුඨාරොපමාඃ එව, කෙටේරියක් වැන්නේමය.

මෙම ශ්ලොකයෙන් ශිවභක්තිකයෙක්වූ මොහ මුද්ගර කර්තෘ විසින් දක්වන ලද අදහස්ම, බෞද්ධ ලබ්ධිකයින්ට රුචිවන පරිද්දෙන් සුභාෂිත කර්තෘ කවියට නගා තිබෙනබව පැහැදිලිලෙස පෙනේ. විස්තර වශයෙන් තේරුම් ගන්න පිණිස සුභාෂිතයේ එම 47 වෙනි කවියද මෙහි පහත දක්වමු.

බු දු න් දහම් සඟනට නොකලෙම් අද ර
නිව න් දකින පිනකුත් නොකලෙම් පව ර
ලිය න් තන නොසිපියෙම් සිහිනෙන් විත ර
උප න් නෙ ම යොවුන් වනයට පොරෝ යු ර

මෙම කවියේත් ඉහතකී ශ්ලොකයෙන් පරමාර්ථය එකක්මබව දුත් කාටත් පෙණෙයි. නුමුත් කවියේ සැලකියයුතු වැඩි විශෙෂයනම් "නොකෙලෙම්" ආදී ක්‍රියා පද මශබ්දකාරකයෙහි යොදා තිබීම පමණයි—එය කාලාන්තරයෙන් පැමිණි ලිපි දෝෂ මෙන් සලකමු. තවද සුභාසිත කර්තෘ ගැන සමහරුන් තුළ පැවති වරද කල්පනාව මෙයින් දුරිභූතවේයයි විශ්වාසකරමු.

වැලිගම් පලාතේ විවාහ ලේකම් තනතුර දරණ සිංහල භාෂා තත්වඥානන යෙහි ප්‍රසිද්ධ දොන් අන්ද්‍රිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම් මහත්මයාගේ ආධාරෝපකාර ඇතුව (කොළඹ විනු) රොබර්ට් විල්සන් දියස් බන්ඩාරනායක මැයිතුමා විසින් මෙම සුභාෂිතය සන්නෙකොට පළමුවෙනි වරට වර්ෂ 1868 වෙදි අච්චුගස්වා ප්‍රසිද්ධ කරණලද්දේය. එම උගත් මහතා විසින් අච්චුගස්වනලද පොත් දැනට රටේ ලබාගන්ට නැති බැවින් කිපදෙනෙකුගේ ඉල්ලීම පිට නැවතත් මේ වතාවේ අප විසින් අච්චුගස්වා ප්‍රසිද්ධ කරණ ලද්දේය.

සත්දත් විලියම් පෙරේරා රණසිංහ ශ්‍රෙෂ්ඨාධිකරණ සභාවේ පෙරකදෝරු මහත්මයා විසින් පහසු ලැබුන පරිද්දෙන් සිබිපත් බලා වරද හරිගස්සා දුන්බව සතුති සහිතව මෙහි දන්වා සිටිමු.

**G. H. Perera**
ජී. එච්. පෙරේරා

වර්ෂ 1883 ජනවාරි මස 25 දින
කොළඹදීය

හරසවිය, හරසවහිසද; සිරිකාන, ශ්‍රීකාන්තාවද; මෙරජමෙවන, මේ නරේන්ද්‍රයා සමීපයෙහි; වසන, වාසයකරණ කල්හි; සතත, බ්‍රහ්මයා; ස පත විශෝධක්, සවි ප්‍රාප්තවූ විශෝද්ධඃඛය; ඉදු. සෑජුවම, සිත නොහැමනරවිත්, මෙමෙහසි නොකාරමින්; සතත, නිරන්තරයෙන්; බඹසරම රැකිමෙයන්හිස, බ්‍රහ්ම චය්‍යාවම රක්‍ෂාකල හෙ සිත් හිස; සකතළෙන, පිළ්ණුපුමෙන්; සොවින්, ශෝකයෙන් (දුක්ගැවිතව) ගත, ශරීරය; කළු නොමවෙද, කාලවර්ණ නොවන්නේද (වන්නේමැයි)

"හ ර සු ර  ගඟ තරග රඟ යසැති සුනිම  ල
වැ ද න ර  සර මෙරජ සෙත් යුගත සැඩ න  ල
මැති ව ර  තුමුල සත්කුලගිරි පෙළිනව  ල
රුපු න ර  වර සුනෙර මුලින්හිල ගිය බ  ල"

හර, ඊශ්වරයාගේ; (මසනතකෙහිවූ) සුරගඟ, ආකාශගංගාවෙහි; තරඟරඟ, රළපතරමෙන්; සුනිමල, අතිශයින් නිර්මලවූ; යසැති, යශස් ඇතිතාවූ; තාසර, සපිරසාරවූ; මෙරජ, මේ නරේන්ද්‍රයාගේ; සෙත්, (සිවුරඟ) සේනා සමූහ; යුගත සැඩකල්වැද. යුගාන්ත චණ්ඩමාරුතය වැද්දමත්; මැතිවර, මන්ත්‍රිවර සමූහ; තුමුල, මහත්වූ; සත්කුල ගිරිපෙළින්, සප්තකුල පර්වතපංක්තියෙන්; අචල, ආකුලවූ නොවන පිරිවැරුවාවූ; රුපුනරවර, ශත්‍රු නරේන්ද්‍රනමැති; සුනෙර, මේරු පර්වතය; ඉගිලගිය, උඩාතව ගියේය; බල (මේ විස්මය) නිරීක්‍ෂණය කරව.

"ඉඳ දෙ ව  ලිය තුඟතුල් සුනෙර ගිරි හි  ස
හි ම ප ව  දෙස සිදුවිදුදර කිඳුරු රැ  ස
පි රි ස ව  සිරි මෙනිරිඳු තිපු කියන ලෙ  ස
වි ය ඔ ව  නොවුනට රැව් පිළිරැව් විල  ස"

තුඟතුල්, තුංග සදෘශවූ හෙවත් උස්මහත්වූ; සුනෙර ගිරිහිස, මේරු පර්වත මස්තකයෙහි; දෙව්ලිය, දිව්‍යස්ත්‍රීන්ද; හිම පව් දෙස, හිමවත් පර්වත ප්‍රදේශයෙහි; සිදුවිදුදර කිඳුරුරැස, සිඬවිද්‍යාදර කින්නර (යන්) සමූහයන්ද; ඉද, උපදෙවශයෙන කොට; සවිසිරිපිරි, සකලශ්‍රීන් පූර්ණවූ; මෙනිරිඳු, මේ නරේන්ද්‍රයාගේ; තිපු, සෘතී (ගීතිකාවන්) කියනලෙස, කථනකරණ ආකාරය; ඔවුනොවුනට, අන්‍යොන්‍යයන්ට; රැව්පිළිරැව් විලසවින, රාව ප්‍රතිරාවහා සමානව්.

ඕලන්දසින්ට බාරදුන් පලාත්වල පදිංචිකාරයින්ගේ සම්ගම් ලියා තෝමබූවක් සෑදීම පිණිස මෙම අලගියවන්න මොහොට්ටාල කිව්තුමා ගම්ගමවට සංචාරණයකරනිබේ. ඒ කාලේදී බොහෝ බලපුළුවන්කම් ඕලන්ද ආණ්ඩුවෙන් මෙතුමාට ලැබී තිබුන බවත් හදෙනෙක් වනතුරු මරණීය දඬුවමට පත්කිරීමේ බලයපවා ලබාසිටින බවත් කාරණ කාරණා දැනුම් තේරුම් ඇති උගත් අය කියති. දකුණුපලාතේ අලගියා නමැති පදුවෙක් තම දීමට ඉදිරියට පැමිනිකල "තමේ නම මොකදැයි" මෙම පඬිතුමා ඇසුවිට ඔහුපාවට උත්තරදෙමින් "එත් මෙන" ක්වෙදී. නැවතත් ඇසුවිට එසේම සොසැලකිලිලෙස උත්තර දුන්නේද. එවිට මෙහු උඩඟුකමින් මෙසේ උත්තර දෙනබව දැන තමන් මෙහෙකාරුවන්ට අසදී පුවක්ගස් දෙකක් එකට අලවා අතුරුබැඳ ඒ ගස් දෙකේ පදුවාගේ දෙපය

ඇද බැඳ පුවක්ගස් දෙක එකට එකතුකර බඳින ලද අතුරු පට එකවිට කපා හරින්ට සැලැස්සුවේය. එවිට පුවක්ගස්දෙක දුනට ඊ සිවී අලගියා දෙපළුව ගියේය යන මුඛපරම්පරා කීමක් වේ දන්වා පවති. ඒ කාලේදී අලගියවන්න මොහොට්ටාල පඬිතුමානන් විසින් යොදනලද හෝබ්බුවට "ලංසිහෝම්බුව" යන නාමය මේ දක්වාම ව්‍යවහාර කරති.

මෙම පඬිතුමාණන්ගේ නිජගමවූ හිස්වැල්ල * පිහිටා තිබෙන්නේ සීතා කෝරළේ ගඟබඩ පත්තුවේ පූජාබඩ දංගල්ල යන ගම් සමීපයේය, එතුමාගෙන් පැවත එන වැදගත් උදවිය "අලගිය වන්න බේනාතානක මොහොට්ටි අප්පුහාමිල්ලාගේ" යන නමින් නාරන්ගස් පිටිය යන ගමේ මේ දක්වා ජීවත්ව සිටින බව වැදගත් කීපදෙනෙකුගෙන් දැනගතිමු. තවද රයිගම්කෝරළේ පතාහ වත්තේ විගාමර් විසූ 'නාරන්ගස් පිටියේ තෙරුන්නාන්සේ'' අලගියවන්න මොහොට්ටාල කිවිතුමාගේ මුනුබුරෙකැයි වැදගත් උගත් මිනුමෙයකුගෙන් දැනගතිමු. නිජගම වූ හිස්වැල්ලේ දැනට වගුම්පුර මිනිස්සු පදිංචිව සිටිත්ලු. මෙම පඬිතුමාගේ වලව්ව තිබුණේ බොරලුත්පිටිය යන ගමේය. මේ ගම තිබෙන්නේ මිල්ලෑවේ සහ රතඹලේට්ටත් අතරේය. වලව්ව තිබුණු වත්තේ දැනට කොස්ගස් පමණක් තිබේ. "බංගලගේ වත්ත" යන නමින් මේ දක්වාම ඒ ඉඩමට නම පවතී. කඩවත හිස්වැල්ල නිසා එම කඩවතේ මුරකාරයින් සිටවීම යනාදී රාජකාර්‍ය සම්බන්ධව මොහොට්ටි නිලය ලැබී තිබුණේය"යි දැනගතිමු.

මේ ඇර මෙම පඬිතුමාගේ ජීවිත කථාව සම්බන්ධව තවත් කාරණා දැනගැනීමට බොහෝ උත්සාහ දැරූ නමුත් වැඩි සඵලයක් නූනබව කියමු. මෙතුමා මරණාසන්නකාලේදී මරුවාට කීවාය කියන කවියක්ද සොයාගන්ට පුලුවන්වුන බව ඉතා ප්‍රීතියෙන් දන්වාසිටිමු. ඒ කවිය මෙසේය:—

කා ත් නැතෙයි නොසිතන්න මරුව මගෙ පුරබ ලේ
මා ත් මගේවග දන්නො මාදනොදමිති කැ ලේ
මා ත් ගතිම් නම් යමරජුගෙන් ඔය මරුනි ලේ
තා ත් තාගේ අඹුවත් නටවමි මම දෙරපි ලේ

මෙම සුභාසිතයෙහි 47 වෙනි කවිය සම්බන්ධව සමහරු වරද කල්පනාවකට වැටී සිටිත් අලගියවන්න මොහොට්ටාල කිවිතුමා කිසි ආගමක් විශ්වාසනොකළාවූ ලෝක චාරිත්‍රානුකූල පරිද්දෙන් යශ්‍රීසම්පත්තිය ආදී කිසි සැපතක් නොවිත් දුවූ කාලකන්නි නපුංසක පුද්ගලයෙකැයි සමහරුන්ගේ මතයි. මෙම ග්‍රන්ථ කර්තෘ නමස්කාර වශයෙන් තමන් පොත්පත්වල නොයෙක්තැන කියාතිබෙන කවිගැන කල්පනාකර බලන කල එතුමා බුද්ධභක්තිකයෙක් බව නිසැකවම පිළිගන්ට සෑහෙන කාරණා තිබේ. 47 වෙනි කවිය කියාතිබෙන්නේ ග්‍රන්ථකර්තෘ ගැණි යමක් ලොකයාට හැඟවීම සඳහායයි පිළිගැනීම පණ්ඩිත ගෝචර නොවේ. මේ කවියේ අදහස ප්‍රකාශව තිබෙන "මෝහමුද්ගරයේ" තිබෙන ශ්ලෝකයක් මෙහි පහත බහාලමු

* හිස්වැල්ල කෝරළනුණට නඩිපිමයයි සමහරු කියති. රාජසිංහරජ කාලයේදී පැවතුන සීතාවක පුරයේ කඩඉම වෙත්ටද පුළුවනැයි සිතමු.

# සු භා ෂි ත ය.

1 ස ත වෙත පත මෙත සගහස සෙව් පයි ඳු
අ ව න ත සුරමතැ මිණිතර සර පුබු දු
දි ගු ර තැ ඟිලි දලපෙල මොක් සුවඳ රු දු
සි ය ප ත සිය සියපත සියපත නම දු

1. සතවෙත, සත්වයාහට; පත, පැමිණියාවූ; මෙත මෛත්‍රීඇති; පයිඳු, ප්‍රසිද්ධවූ; සගහස, සඞ්ඝ නමැති හංසයන් විසින්; සෙව්, සේවනය කරනලද්දාවූ; අවනත, (නමස්කාර වශයෙන්) නැමුනාවූ; සුරමත දෙවියන්ගේ මස්තකයෙහි; මිණිතර සර, මාණික්‍ය රශ්මි නමැති විලෙහි; පුබුදු, පිපුනාවූ; දිගු, දිගුවූ; රතැඟිලි දලපෙල, රතුඇඟිලි නමැති පත්‍ර පඞ්ක්ති ඇති; මොක් සුවඳරුදු, නිවන් නමැති සුවඳින් රුදුනාවූ; සියපත සියසියා, සූර්‍ය්‍යබන්ධුනුගේ හෙවත් බුදුන්ගේ; පතසියපත, පාද නමැති පද්මය; නමදු, නමස්කාරකර.

2 උ තු ම් ද හ ම් රජ මුවගිරගින් පහ ළ
අ ද ම් ම ගි ම් හල මොක්වෙරලතින් දු ල
නොහිම් සි ශු ම් නයමිණි පද අරුත් ර ල
ස ද ම් ස ද ම් ගඟ මමුදුනැ බැතින් ද ල

2. උතුම් දහම් රජ, උත්තම ධර්මරාජයාගේ; මුවගිරයින්, මුඛනමැති පර්වතාග්‍රයෙන්; පහල, පහළවූ; අදම්ම ගිම් හල, අධර්ම නමැති ග්‍රීෂ්ම දුරුකළාවූ; මොක්වෙරලතින්, නිවන් නමැති වෙරළින්; දුල, බබලන්නාවූ; නොහිම්, කෙලවරක් නැති; සිශුම්නයමිණි, සූක්ෂ්මවූ නුම නමැති මාණික්‍යඇති; පද අරුත් රල, පදාර්ථ නමැති තරඞ්ගඇති; සදම් ගඟ, සද්ධර්ම නමැති ගංගාව; දලබැතින්, මහත් භක්තියෙන්; මමුදුනැ, මාගේ මස්තකයෙහි; සදම්, සජ්ජනකෙරෙම්.

3 සි ය ප ත් සැදූ බඹ සුර නර උරග ම් . ත
සැ රි යු ත් මහ මුගලන් පිලිවෙළිනි ප ත
පි ළි වෙ ත් සරු මහසඟනට මුනිඳු සු ත
මු දු න ත් දි බැතියෙන් නමදිම් ස ත ත

3. බඹසුරනරඋරඟ, බ්‍රහ්ම දෙව නර නාගයන්ගේ; මිත, මස්තකයෙහි; සියපත් සැදූ, ස්වකීය පාදය සැදූවාවූ; සැරියුත් මහමුගලන් පිළිවෙළින්, සැරියුත් මහ මුගලන් පරම්පරාවෙන්; පත, පැමිණුනාවූ; පිළිවෙත්සරු, පිළිවෙත්සාරවූ; මුනිඳු සුත, බුද්ධ පුත්‍රවූ; මහසඟනට, මහාසංඝයාට; සතත, නිරන්තරයෙන්; මුදුනත්දි, මුදුනට තබා; බැතියෙන්, භක්තියෙන්; නමදිම්, නමස්කාරකෙරෙම්.

4 සත් අත් තිනෙත් සතරත් නත් සිසිරක ර
පත් මත් සවත් විදුරත් පුත් තුසරක ර
වත් අත් තලත් කිවි රත්ගත් ගුරු අම ර
සෙත්දෙත් මෙ සත් සුර සත්සිත් ලෙසනිත ර

**4. සත්අත්, බ්‍රහ්මයා; තිනෙත්, ඊශ්වරයා; සතරත්, විෂ්ණුයා; නත්, අනන්ත නම් නාගරාජයා; සිසිරකර, චන්ද්‍රයා; පත්මත්, සූර්‍ය්‍යයා; සවත්, ස්කන්ධකුමාරයා; විදුරත්, ශක්‍රයා, තුසරකරපුත්, බුද්ධයා; වත්අත්, ගණෙශ්වරයා; තලත්, බලභද්‍රයා; කිවි, ශුක්‍රයා; රත්ගත්, කුජයා; අමරගුරු, බෘහස්පතියා; (යන) මෙසත්සුර, මේ යහපත් දෙවිවරු; සත්සිත්ලෙස, සත්වයාගේ සිත්වූපරිද්දෙන්; නිතර. නිරන්තරයෙන්; සෙත්දෙත්. ශාන්තිදානය කෙරෙත්වා.**

5 පහල පොරණ ඉසිවර මුවෙනි මනන ද
දෙමල සකු මගද නොහසල සතට ද
පුවල නිති සතගත පද අරුත් ලෙ ද
සිහල බසින් සැකෙවින් කියමි පදබැ ද

**5. මනනද, සිත් සතුටුකරන්නාවූ; පොරණ ඉසිවර මුවෙනි, පුරාණ ඍෂිවර යන්ගේ මුඛයෙන්; පහල, පහළවූ; දෙමළ සකුමගද නොහසල, දෙමළ සංස්කෘත පාලි පුරුදු නැත්තාවූ; දදසතට, අනුවන සත්වයාට; පුවල, මහත්වූ; නීතිසත, නීති ශාස්ත්‍රයාගේ; ගතපද, ග්‍රන්ථපදයන්හි; අරුත්ලෙද, අර්ථවිලාසය; සැකෙවින්, සංක්ෂෙපයෙන්; සිහලබසින්, සිංහල භාෂාවෙන්; පදබැද, පද්‍ය බන්ධනයකොට, කියමි, කථනයකරමි.**

6 එබැවින් සොබෙහි වියතිනි ගුණයුත් පව ර
කිරියෙන් දියර වෙන් කල හසමෙන් පත ර
මවිසින් කියන මෙහි වරදක් දුටත් හැ ර
සතොසින් අසව් පදරුත් විමසා ගැඹ ර

**6. එබැවින්, එසේහෙයින්; සෙබෙහි, සභාවෙහි; පවර ගුණයුත්, උතුම්වූ ගුණයෙන් යුක්තවූ; වියතිනි, පණ්ඩිතවරුණි; කිරියෙන්, කිරෙන්; දියර, ජලය; වෙන් කල, වෙන්කලාවූ; පතර, මහත්වූ; හසමෙන්, හංසයන්මෙන්; මවිසින් කියන, මා විසින් කියන්නාවූ; මෙහි, මේ කාව්‍යයෙහි; වරදක්, වැරැද්දක්; දුටත්, දුටුවත්; හැර, අත්හැර; ගැඹර, ගම්භිරවූ; පදරුත්, පදාර්ථයන්; විමසා, පරීක්ෂාකොට; සතොසින්, සන්තොෂයෙන්; අසව්, ශ්‍රවණයකරව්.**

7 පබද කිවින් බැඳි කව්රසෙහි විසිතු රු
සබඳ විදු දනෝ පලකෙරෙත් දියතු රු
තොමද රසින් දිවයුරු පොබයසි තඹු රු
සුවඳ දිගත විහිදැයි හමන මදම රු

දිවසුරු, සුසසිතෙම; නොමඳරසින්, බොහෝවූ රශ්මියෙන්; පැසුරු, පැරුම මල්; පොබයයි, ප්‍රබෝධකරයි; ගමන වදමරු, ගමන්කාවූ මද පුළුගතෙම; දිගත, දිගන්තයෙහි; සුවඳ, සුගන්ධය; විහිදයි, විහිදුවයි; (එමෙන්) පබද, ප්‍රසිද්ධවූ; කිවින්, කාව්‍යකාරයන් විසින්; බැඳි, බැන්දාවූ; කව්රසහි, කාව්‍යරසයෙහි; විහිතුරු, විචිත්‍රය; සබද, සම්බන්ධවූ නොයෙක් මිනුවූ; විදුදනෝ, පණ්ඩිත ජනයෝ; දියතුරු, ලෝකය අතුරෙහි; පළකෙරෙති, ප්‍රකාශකෙරෙත්ය,

8 කි වි ප ද  බැඳුම් ගුණ දෙස කිවිඳෝම මි  ස
නැණ මද  කුකවි දූනගතහෙති කවර ලෙ  ස
ද රු ල ද  අඟනෝම මිස පසවෙහි වෙහෙ  ස
ව ඳ ල ද  ගනෝ දූනගතහෙති කවරලෙ  ස

8 දරුලද අඟනෝම මිස, දරුවන් ලත් ස්ත්‍රීහුම මිසක්; පසවෙහි වෙහෙස, ප්‍රසවයෙහි (වැදීමෙහි) වෙහෙස, වෙහෙසය; වඳලදගනෝ, වඳවූද බාලවූද ස්ත්‍රීහු; කවරලෙස, කොයි ආකාරයෙන්; දූනගතහෙති, දූනගතහෙත්ද; (නොහෙතමය) (එමෙන්) කිවි, කවින්ගේ; පදබැඳුම්, පදබැඳීමෙහි; ගුණදෙස, ගුණදොෂය; කිවිඳෝමමිස, කවීන්ද්‍රයෝම මිසක්; නැණමද, නුවණමඳවූ; කුකවි, නින්දිත කවිහු; කවරලෙස, කවරාකාරයෙන්; දූනගතහෙති, දූනගතහෙත්ද; (නොහෙත්මය)

9 උ තු මි  නිවන් සැප සපයා දෙනා මහ  ත
ද හ මි  රජ සමය නොගණිති කුදිටු ස  ත
නොහි මි  සුවඳ විහිදෙන සිරි රුදි දිමු  ත
පි යු මි  වෙනෙහි නිල මැසි කැල නොහැසිරෙ

9 නොහිමි, ඉමක්නැත්තාවූ; සුවඳ විහිදෙන, සුගන්ධ විහිදෙන්නාවූ; සිරිරුදි, ශ්‍රීරූඪවූ; දිමුත, දීප්තිමත්වූ; පියුම්වෙනෙහි, පද්ම වනයෙහි; නිලමැසි කැල, නිලමැසි සමූහයෝ; නොහැසිරෙත, නොහැසිරෙත්ය; (එමෙන්) උතුම් උත්තමවූ; නිවන් සැප, නිර්වාණ සැපය; සපයාදෙන, ලබාදෙන්නාවූ; මහත, මහත්වූ; දහම්රජ, බුදුන්ගේ; සමය, ආගම; කුදිටුසත, මිථ්‍යාදෘෂ්ටි සත්වයෝ; නොගණිති නොගනිත්ය.

10 රු ව න්  මිල නොදත් අනුවන දන වෙල  ද
ලොබි න්  කඳුමැරි මිණිසයි රුගත් ලෙ  ද
ප ස න්  මුනිවරන් හැර අන් සුරන් වැ  ද
නි ව න්  පතා අනුවන සත කරණ ලෙ  ද

10 පසන් මුනිවරන් හැර, ප්‍රසන්නවූ සර්වඥවරයන් අත්හැර; අන් සුරන් වැඳ, වෙන දෙවිවරුන් නමස්කාරකොට; අනුවන සත, අඥාන සත්වයා විසින්; නිවන් සැප, නිර්වාණය ප්‍රාර්ථනාකොට; කරණලද, කරන්නාවූලෙස; (කෙසේද)

රුවන් මිල නොදන්, මැණික්වල අගේ නොදන්නාවූ; අනුවන, අඥානවූ; වෙළෙඳ දන, වාණිජ ජනයා; ලොබින්, ලොභයෙන්; කාලුමැට්, විදුරු; මිණියයි, මැණික් යයි; (සිතා) රැගන්නේද, හැරගන්නාක් වැන්න,

11 නා ද න  මුනිඳු හැර අන් සුරණට පැව  තා
නි ව න  පතා අඥාවන සත කරණ තැ  තා
ල බ න  පිණිස තෙල් ලොබ වඩවමිනි සි  තා
ම ඩි න  වැන්න වැලිමලු ලමිනි තෙලිය  තා

11 නදන මුනිඳු, සතුටුඋපලවන්නාවූ බුදුන්; හැර, අත්හැර; නිවන පතා නිර්වාණය ප්‍රාර්ථනාකොට; අන්සුරණට, වෙනදෙවිවරුන්ට; පැවිනි, පැවැති; අනුවනසත, අඥානජනයා විසින්; කරණ තැන, කරන්නාවූ උත්සාහය; (එසේද) තෙල් ලබන පිණිස, තෙල් ලැබීමට; සිත, සිතනයි; ලොබ වඩවමින්, ලොභ වඩවමින්; තෙලියන, තෙලයන්නාසෙන; (පැහෙන) වැලිමලුලමිනි, වැලි මලු දමමින්; මඩිනවැන්න, මිරිකන්නාක්වැනිය,

12 ස ක ල  සුරනරන් මුදුනතැ සැදු ප  ද
වි පු ල  මුනි සරණ හැර අන්සුරන් වැ  ඳ
නි ම ල  මොක් පිණිස සත රකිනා දුල  ද
දි බු ල  මල නිසා වෙහෙසුනු වැනි දියැ  ද

12 සකල සුරනරන්, සියලුදෙවිමිනිසුන්ගේ; මුදුනතැ, මුදුනෙහි; සැදුපද, සද කළෙද පාද ඇත්තාවූ; විපුලමුනි, මහත්බුදුන්ගේ; සරණ, සරණය; හැර, අත් හැර; අන්සුරන්වැද, වෙනදෙවිවරුන් නමස්කාර කොට; නිමල මොක් පිණිස, නිර්මලවූ නිර්වාණය පිණිස; සතරකිනා, සත්වයා විසින් රක්ෂාකරන්නාවූ; දුලද, මිථ්‍යාදෘෂ්ටිය; (එසේද) දිවුලුවල නිසා, අත්තික්තාමල් උදෙසා; දියැද, වතුර ඇද; වෙහෙසුනු වැනි, වෙහෙසුනාක්වැනි.

13 පු න්  පිරිසිදු සිල්මුල් ගුණකඳින් යු  ති
ද න්  කම නැණ කුරුමල් සා මඩුලු ඇ  ති
පි න්  කප් තුරු සග මොක්පල දෙන කැම  ති
ම න්  සුදනන් මෙත් සිලිලෙන් වැඩෙයි නි  ති

13 පුන්, පිරුණාවූ; පිරිසිදු, පවිත්‍රවූ; සිල්මුල්, සීලනමැති මුල්ඇති; ගුණක ඳින්යුති, ගුණනමැති කඳින් යුක්තවූ; දන්කමනැණ, දාන ක්ෂමා ඥාන නමැති; අකුරුමල් සාමඩුලු ඇති, අඞ්කුර පුෂ්ප ශාඛාමණ්ඩල ඇත්තාවූ; කැමති, කැමැත් වූ; සගමොක්පල, ස්වර්ගමොක්ෂපලයන්; දෙන, දෙන්නාවූ; පින් කප්තුරු, කුසල් නමැති කල්පවෘක්ෂය; සුදනන්, සත්පුරුෂයන්ගේ; මන්, සිත්හි; මෙත් සිලිලෙන්, මෛත්‍රිය නමැති ජලයෙන්; නිති, නිතර; වැඩෙයි, වර්ධනවෙයි.

14 පියකර සතර බඹ විහරණ සිව්පෙදෙ නී
වැර සැර නැණ යුවල දළ දිලි දම්සොඬී නී
පූව තර තුමුල මනවරණිඳුව නැගෙමි නී
මහා හර සෙත් පුරට පැමිණෙව් සව්සතු නී

14 පියකර, ප්‍රියකරවූ; සතර බඹ විහරණි සිව්පෙදෙහි, සතර බ්‍රහ්ම විහරණ නමැති පාද සතරක් ඇති; වැරසැර නැණ යුවල දළ, වීර්‍යසාරය හා ඥානය නමැති දන්ත යුගලයක් ඇත්තාවූ; දම් සොඬිනි, ධර්මනමැති සොඬින්; දිලි, දීප්තිමත්වූ; පුවතර, පුසිඬවූ; තුමුල, මහත්වූ; මනවරණිඳුව, මනා හස්තිරාජයාට; නැගෙමින්, නගිමින්; සව්සතුන්, සියලු සත්වයින්; මහාහර, සියගත්තාවූ; සෙත් පුරට, නිර්වාණපුරයට; පැමිණෙව්, ප්‍රාප්තකෙරෙව්.

15 නිදෙස් ගුණ බරණ සදහම් කිරුළ ද රා
වෙසෙස් සිල් සෙනග ගෙණැ මෙත් තුරඟ අ රා
කෙලෙස් රුපුන් සිඳ නැණකගිනි නොමහැ රා
සතොස් රජසිරින් පැමිණෙව් නිවන්පු රා

15 නිදෙස් ගුණබරණ, නිර්දෝෂගුණ නමැති ආභරණය හා; සදහම්කිරුළ, සද්ධර්ම නමැති ඔටුන්නද; දරා, ධාරණයකොට; වෙසෙස්, ප්‍රභේදවූ; සිල්සෙනග, සීලනමැති සේනාව; ගෙණ, ග්‍රහණයකොට; මෙත් තුරඟ අරා, මෛත්‍රී නමැති අශ්වයාට නැගී; කෙලෙස් රුපුන්, කෙලෙස් නමැති සතුරන්; නැණ කගිනි, ඥාන නමැති කඩුවෙන්; නොමහැර, අත්නොහැර; සිඳ, ඡේදනයකොට; (කපා) සතොස් රජසිරින්, සන්තෝෂවූ රජලීලාවෙන්; නිවන්පුර, නිර්වාණ පුරයට; පැමිණෙව්, ප්‍රාප්තවව්,

16 ඇතත් නැතත් පරලොව සුදනෙනි මහ තා
හලොත් යෙහෙකි පව්නම් නොතබාම සි තා
නැතත් එපරලොව ඉන්වන අවැඩ නැ තා
ඇතොත් නැතැයි පව්කලහට වෙයි විප තා

16 මහතා, මහත්වූ; සුදනෙනි, සත්පුරුෂයෙනි; පරලොව, පරලොකය; ඇතත් නැතත්, ඇතිනමුත් නැතිනමුත්; පව්නම්, පාපකර්මය; සිතා, සිතෙහි; නොතබාම, නැබ්ම නොකොටම; හලොත්, හැරියහොත්; යෙහෙකි, යහපතකි; එපර ලොව, ඒ පරලොකය; නැතත්, නැතිනමුත්; ඉන්වන, එයින් වන්නාවූ; අවැඩ, අවැඩෙක්; නැත, නැත්තේය; ඇතොත්, ඒ පරලොකය ඇත්තේනම්; නැතැයි පව්කලහට, නැත්තේය සිතා පාපකලතැනැත්තහුට; විපතවෙයි, විපත්තිය වෙයි.

17 නැගෙතත් අවර ගිරගින් දිනකර මඬ ල
පිපෙතත් ගිරිමුදුනැ හෙල්මැලි පියුමුපු ල
සැලෙතත් සුනෙර පවනින් සෙදෙතත් අන ල
බොරු නැත් නොමය මහතුන් පැවසු තෙපු ල

17 අම්බරශිරයින්, අපර පර්වතාග්‍රයෙන්; දිනකරමඬල, සූර්ය්‍යමණ්ඩලය; නැගෙනා, උද්ගතවෙතන්; හිරිමුදුනැ, පර්වත මුදුනෙහි; ගෙලමැලි පිසුම්පුල, ගෙල් මැලිද පෙලුම්ද මහතෙලද; පිපෙනත්, පිපීමවෙතන්; සුගෙර, මහමේරුව; පවනින්, සුලඟින්; සැලෙනගේ, චංචලවෙතන්; අගල, ගිත්හෙත්; ගෙඩෙනත් ගෙවල්එනගේ; මහනුන්, මහාත්මයන් විසින්; පැවසූ, කියනලද; තෙපුල, වචනය බොරුනැත්තෙමය, බොරුනැත්තේමය.

18 පි රි ව ර සෙ න් රකිනා පිණිස නිරතු රු
පෙර නි ය මි න් නිරිඳෝ රැගණිති පඩු රු
සිය ගුණ යෙන් වසිනා වැසි මෙදියතු රු
සි ය කි ර ණි න් දෙරණත රස ගණිය හි රු

18 සියගුණයෙන්, සියක්ගුණයෙන්; වසිනාවැසි, වසින වර්ෂාඇති; මෙදියතුරු, මේලෝකය අතුරෙහි; දෙරණත, භූමියෙහි; රස, රසය; හිරු, සූර්ය්‍යතෙම; සියකිරණින්, තමාගේ රශ්මියෙන්; ගණිය, ගැරහණිය, (එමෙන්) නිරතුරු, නිරන්තරයෙන්; පිරිවරසෙන්, පරිවාරසේනාව; රකිනාපිණිස, රක්ෂාකරණ පිණිස; නිරිඳෝ, නරේන්ද්‍රයෝ; පෙරනියමින්, පූර්වනියමය පරිද්දෙන්; පඩුරු පනාකාර; රැගණිති, ගැරගණිත්ය.

19 කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පව ර
උ ද ක් ලොව සතුන් සිතැ දුක් කෙරෙහි දු ර
ප ස ක් රාහු මුව පත් වමිනි බියක ර
අ නි ක් පසින් ලොවහෙළිකෙරෙය හිමක ර

19 බියකර, භයංකරවූ; රාහුමුව, රාහුගේ මුඛයට; පසක්, පාර්ශ්වයකින්; පත්වෙමිනි, ප්‍රාප්තවෙමින්; අනික් පසින්, අනික් පාර්ශ්වයෙන්; හිමකර, චන්ද්‍ර තෙම; ලොව, ලෝකය; හෙළිකෙරෙයි, එළිකෙරෙයි; (එමෙන්) පවර, උතුම් වූ; සුදනෝ, සත්පුරුෂයෝ; කොතෙක් වෙහෙස ලදුවත්, කොපමණ වෙහෙස ලැබුවත්; උදක්, තරාතර; ලොවසතුන්, ලෝකයාවාසීනගේ; සිතැදුක්, සිත්හි දුක; දුරුකෙරෙති, දුරුකෙරෙත්.

20 පින්මද පුතුන් සියයක් ලදුවත් නිස රු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ග රු
එක පුන්සඳින් දුරුවෙයි ලොව ගන අඳු රු
නෙක තරු රැසින් එලෙසට නොමවේය දු රු

20 ලොවැ, ලෝකයෙහි; ගනඅඳුරු, ඝනාන්ධකාරය; එකපුන්සඳින්, එක පූර්ණචන්ද්‍රයා කරණකොටගෙණ; දුරුවෙයි, පහවෙයි; නෙකතරු රැසින්, නොයෙක් තාරකා රාශියෙන්; එලෙසට, ඒ ආකාරයට; දුරු නොමවේය, පහනොවේ; (එමෙන්) පින්මද එක්වූ; පුතුන්, පුත්‍රයන්; සියයක් සියයක්; ලදුවත්,

ලැබුවන්; නිසරු, නිස්සාරය; ඉතාගරු, ඉතා ගරුකළයුතුවූවන්; ගුණනැණ බෙලෙන්, ගුණයෙන්ද නුවණින්ද බලයෙන්ද; පුතු, පුත්කුමරු; පුතැමියි, පුත්‍රයා මයි.

21 විපුල නැණැති මහතුන් හට පත් විප ත
නිසල නැණින් යුතු උතුමෝම දුරල ත
කලල ගිලුනු මතවරනිඳු ගොඩගනු ත
තුමුල බලැති ගිජිඳෙක් මිස අන්කෙව ත

21 කලල ගිලුනු, මඩෙහි ගිලුනාවූ; මතවරනිඳු, මත්තහස්තිරාජයා; ගොඩගනුත, ගොඩගණිනාහොත් තුමුලබලැති, මහත් බල ඇත්තාවූ; ගිජිඳෙක්මිස, ගජේන්ද්‍රයෙක් මිසක්; අන්කෙවත, වෙන කවරෙක් පොහොසත්ද? (එමෙන්) විපුල නැණැති, මහත්වූ නුවණ ඇත්තාවූ; මහතුන්හට, මහාත්මයන්ට; පත්විපත, පැමිණි විපත්තිය; නිසල නැණින්, නිශ්චල නුවණින්; යුතු, යුක්තවූ; උතුමෝම, උත්තමයෝම; දුරලත, දුරලති.

22 කුළුණුගුණෙන් යුතු උතුමන් සිත මහ රු
දුදන බසින් නොයෙදෙයි කරණට නපු රු
නව රුවනින් පිරිමහ සමුදුර ගැඹු රු
තණ සුල කින් හුණුකලහැකිවෙද කවු රු

22 නවරුවනින්, නවරත්නයෙන්; පිරි, පිරුණාවූ; ගැඹුරු, ගම්භීරවූ; මහ සමුදුර, මහාසමුද්‍රය; තණසුලකින්, තණකොල පන්දමකින්; කවුරු, කවුරුන් විසින්; හුණුකලහැකිවෙද, උෂ්ණකල හැකි වන්නේද; (නොලැබෙයි) (එමෙන්) මහරු, පූජ්‍යවූ; කුළුණු ගුණෙන්, කරුණාගුණයෙන්; යුතු, යුක්තවූ; උතුමන්, උත්තමයන්ගේ; සිතු, චිත්තය; දුදනබසින්, දුර්ජනයන්ගේ වචනයෙන්; නපුරුකරණට, නපුරුදේ කිරීමට; නොයෙදෙයි, යෙදීම නොවෙයි.

23 සුර තුරු වන් උතුමෙකු දෙන දනින් මි ස
යදි කලි මන් කෙසෙ දුරුවෙද මුලින් පි ස
මහ මෙයකින් පහවන ගනෙහි සරතැ ස
පිනි බිඳ කින් වැලකියහැකිවෙද කෙලෙ ස

23 මහමෙයකින්, මහමේඝයකින්; පහවන, පහවන්නාවූ; ගනෙහි, ශරීරයෙහි; සරතැස, ග්‍රීෂ්මය; පිනිබිඳකින්, පිනි බින්දුවකින්; කෙලෙස, කවරාකාරයකින්; වැලකිය හැකිවෙද, වැලැක්විය හැක්වනුලැබේද; (නොලැබේමැයි) (එමෙන්) සුරතුරුවන්, දිව්‍ය වෘක්ෂයක් වැනිවූ; උතුමෙකු, උත්තමයෙකු විසින්; දෙන, දෙන්නාවූ; දනින්මිස, දානයෙන් මිසක්; යදිකලිමන්, යාචකයන්ගේ ලෝභ සිත; මුලින් පිස, මුලින් සුන්ව; කෙසෙ දුරුවෙද, කෙසේ දුරුවනු ලැබේද. (නොලැබේමය.)

24 දිය නෙත  උදුවන සියකිරණින් මහ  රු
මේ දියත  දිවා බිහි දුරුවෙයි ගන අඳු  රු
සිරිවත  රජතුමෙකු දුටු පමණින් සොඳු  රු
ඇතුලත  පිටත දිව රැ හැරෙය දුකඳු  රු

24. මහරු, මහොඬුවූ; සියකිරණින්, සියක් රශ්මියෙන්; දිනනෙත, සූර්‍ය්‍ය; උදුවන, උදාවූකල්හි; මෙදියත, මේලෝකයෙහි; දිවා, දවල්; බිහි, පිටත; ගනඳුරු, ඝනාන්ධකාරය; දුරුවෙයි, දුරිභූතවෙයි; සොඳුරු, සුන්දරවූ; සිරිවත, ශ්‍රීවත්තවූ; රජතුමෙකු, රාජොත්තමයෙකු; දුටුපමණින්, දුටුවාවූ පමණින්, දිවරැ, දවල්ද රාත්‍රියෙහිද; ඇතුලත පිටත, ඇතුලතද පිටතද; දුකඳුරු, දුඃඛාන්ධකාරය; හැරෙය, පහවේ.

25 සුචරිතෙන්  ගුණෙණින් නුවනින් පසිඳු හැමතැ  න
සුදනන්  සෙවුනා නිරිඳෝ ලෙව්සත රකි  න
දෙසිරුත්  ගුණෙන් ගෙණයන මෙන් සෙමි  න
ශ්‍රී ගුණින්  අද ගණිති සතසිත නොතළමි  න

25. දෙසිරුත්, ගාම්භීරවූ ශිෂ්ට; සෙමින, සෙමින්; මලින්, පුෂ්පයෙන්; රේණුගෙණ, රෙණුගෙණ; යනමෙන්, යන්නාක්මෙන්; සැමතැන, සැම තන්හි; තුවණින්, කරුණාවෙන්ද; ගුණෙණින්, ගුණයෙන්ද; නුවනින්, ඥාන යෙන්ද; පසිඳු, ප්‍රසිද්ධවූ; සුදනන්, සත්පුරුෂයන් විසින්; සෙවුන, සෙවනයකර ණ ලද්දාවූ; සෙවනාලයකියා, ලොක සත්වයා රක්ෂාකරන්නාවූ; නිරිඳෝ, නරෙ න්ද්‍රයෝ; සතසිත, සත්වයාගේ චිත්තය; නොතළමින, පීඩා නොකරමින්; න්යමින්, න්‍යායමවූ පරිච්ඡෙදත්; අගනණිති, අගැණිම කරති.

26 අමයුත්  රස අහරවත් වඩවන බඳ  ස
කුසැගත්  ගිනි නිවන පමණට බුදින ලෙ  ස
නොදකිත්  පතළ නිරිඳෝ නොමද දන රැ  ස
නොකරෙත්  ලොව සතුන් රකිනා විහරමි  ස

26 බඳුවඩවන, බන්ධවර්ධනය කරවන්නාවූ; අමයුත්, අමෘතය; (දිව්‍යආහාරය) සමානවූ; රසඅහරවත්, රස ආහාරය කාවූත්; කුසැ, කුසෙහි; ගත්, ගත්තාවූ; ගිනි, ගින්න; නිවනපමණට, නිවන්නාවූ ප්‍රමාණයට; බුදිනලෙස, අනුභව කරන්නාක්මෙන්; නොදකිත්, තේජකීර්තියෙන්; පතළ, පතළාවූ; නිරිඳෝ, නරෙන්ද්‍රයෝ; ලොවසතුන්, ලොකසත්වයන්; රකිනාවිහරමිස, රක්ෂාකරණ ප්‍රමා ණයට මිසක්; නොමද දන, බොහෝ වස්තුව; රැස්නොකරෙත්, රැශිනොකෙ රති.

27 පැ න ස ර   නොවන නිරිඳුන් ලද රජ සැප   ත
ඝොර ත ර   නිරා දුකටත් වැඩියෙන් විප   ත
තිර ස ර   නැණැති නරවර ලද එම් සැප   ත
සු ර පු ර   සැපතටත් සියගුණෙණි යහප   ත

27 පැනසර නොවන, ප්‍රඥාසාරනොවන්නාවූ; නිරිඳුන්, රජුන්; ලද, ලද්දාවූ; රජ සැපත, රාජසම්පත්තිය; ඝොරතර, ඉතා භයංකරවූ; නිරාදුකටත් වැඩියෙන්, නරකදුඃඛයටත් වඩා; විපත, විපත්තියක; තිරසර, ස්ථිරසාරවූ; නැණැති, නුවණ ඇත්තාවූ; නරවර, නරෝත්තමයන්; ලද, ලද්දාවූ; එම්සැපත, ඒ සම්පත්තිය; සුරපුර සැපතටත්, දිව්‍යපුර සම්පත්තියටත්; (වඩා) සියගුණෙණි, සියක් ගුණයෙන්; යහපත, යහපත්ය.

28 බැ ලූ මෙ න්   සිහිකිරීමෙන් පහසින් නිති   න
ස සු ත න්   රකින මින් කුමු සියොතුන් ලෙසි   න
කු ළු ණෙන්   ගුණ නැණින් යුතු උතුමෝ සොබ   න
වෙ සෙ සි න්   ලොව සතන් රැක පවතිත් තොසි   න

28 නිතින, නිරන්තරයෙන්; බැලූමෙන්, බැලීමෙන්ද; සිහිකිරීමෙන්, සිහිකිරීමෙන්ද; පහසින්, ස්පර්ශයෙන්ද; සසුතන්, තමන්ගේ දරුවන්; රකින, රක්‍ෂාකරන්නාවූ; මීන්, මත්ස්‍යන්ද; කුමු, කූර්මයන්ද; සියොතුන් පක්‍ෂීන්ද; ලෙසින, පරිද්දෙන්; කුළුණෙන්, කරුණාවෙන්ද; ගුණනැණින්, ගුණයෙන් හා ඥානයෙන්ද; යුතු, යුක්තවූ; සොබන, යහපත්වූ; උතුමෝ, උත්තමයෝ; තොසින, සන්තොෂයෙන්; වෙසෙසින්, විශේෂයෙන්; ලෝසතුන්, ලොකසත්වයන්; රැක, රක්‍ෂාකොට; පවතිත්, ප්‍රවර්ත්තන වෙත්.

29 ස ම ව ත   වැසි සුලඟ කෙත්වත් වැවෙන මෙ   න
ලොවසත   රැකෙයි නිසි රජ නැණැති මැතිගෙ   න
එ ම හ ත   නල නලින්වන දහන වන මෙ   න
දු සි රි ත   රජ කුමැතිගෙන් නසිය සැම තැ   න

29 වැසිසුලඟ, වර්ෂාව හා සුලඟ; සමවත, සමානව පවත්නා කල්හි; කෙත් වත්, කෙත් හා වතු; වැවෙන මෙන, වැවෙන්නාක්මෙන්; නිසි, සුදුසු; රජ, රජුහා; නැණැති, නුවනැත්තාවූ; මැතිගෙණ, මන්ත්‍රීගෙන්ද; ලොවසත, ලොකසත්ත්වයා; රැකෙයි, රක්‍ෂාවෙයි; මහත, මහත්වූ; අනලනලින්, ගින්නෙන් හා සුලඟින්; වන, වනය; දහනවනමෙන, දැවෙන්නාක්මෙන්; දුසිරිත්, නපුරු පැවතුම් ඇත්තාවූ; රජ, රජුහා; කුමැතිගෙන්, නපුරු මන්ත්‍රීයන්ගෙන්ද; සැම තැන, සියලු තැන; නසිය, නැසෙයි.

30 නු වි නැ ත්   තවුන් පහකොට දුදනන් සෙවූ   න
නොම ගත්   සිතතුලෙහි ගුණ පොකුරඹ ලෙසි   න
මැ ද හ ත්   නොව මසුරු ගුණයෙන් දවසරි   න
ර ජ් ව ත්   ඇතොරටත් අතුරත් නැත වෙති   න

30 නුවනැත්තවුන්, ඥානවන්තයන්; පහකොට, දුරුකොට; දුදනන්, දුර්ජනයන් ඊසිත්; සෙවුන, සෙවනයකරන්නාවූ; සිතතුලෙහි, සිත්අතරෙහි; පොකුරඹලෙහිනා, නෙලුම්පතෙහි දියක්මෙන්; ගුණ, ගුණය; නොමගත්, නොගත්තාවූ; මැදහත්නොව, මධ්‍යස්ථනොව; මසුරු ගුණයෙන්, මසුරුකමින්; දවසරින, දවස් යවන්නාවූ; රජුටත්, රජහටත්; ඇතොරටත්, අන්තඃපුර ස්ත්‍රීන්ටත්; වෙන්න, (ඔවුන්ගේ ඒ පැවැත්ම මිස) වෙන්නේ; අතුරක්, අන්තරායයක්; නැත, නැත්තේය.

31 පැ මි ණෙ න ලොවට බූනා ගුණ යුතු නපු රු
මෙ දි ය න නසිඳු මිස යහපත නොවේ ස රු
නොනැ ව න යුගනැ පත්වූ සඳෙයි සත් හි රු
වි ක සි ත නොවී දූයෙයි සැමතැන තඹු රු

31 යුගනැ, යුගාන්තයෙහි; සත්හිරු, සප්තසූර්යයන්; පත්වූ සඳෙහි, පැමුණුනු කල්හි; නොනැවන, නොනැවතී; සැමතැන, සැමතැන්හි; තඹුරු, නෙලුම්මල්; විකසිත නොවී, නොපිපී; දූයෙයි, දැවියෙයි; (එමෙන්) නපුරු ගුණයුතු, නපුරු ගුණයෙන් යුක්තවූ; බූනා, රජුන්; ලොවට, ලොකයට; පැමිණෙන, පැමිණි කල්හි; මෙදියන, මේ ලොකය; නසිඳුමිස, නැසෙනු මිසක්; සරු, සාරවූ; යහපත, යහපතෙක්; නොවේ, නොවෙයි.

32 රු දු රු ගිනි කඳක් ගත් සඳෙහි වනතු රු
මි තු රු වේය දිගතින් හමන මද ම රු
මි තු රු නැසීමට එක්වෙයි පස මිතු රු
මි තු රු නෑකෙනෙක් නිවතුන් හට කවු රු

32 වනතුරු, වනාන්තරය; රුදුරු, රෞද්‍රවූ; ගිනිකඳක්, වහ්නිස්කන්ධයක්; ගත්සඳෙහි, ගත්තාවූ කල්හි; දිගතින්, දිගන්තයෙන්; හමන, හමන්නාවූ; මදමරු, මඳ සුළඟ; මිතුරුවේය, මිත්‍රවෙයි; (එමෙන්) මිතුරු නැසීමට, මිත්‍රයා නැසීම පිණිස; පසමිතුරු, අමිත්‍රයා; එක්වෙයි, එකතුවෙයි; නිවතුන්හට, වස්තු නැත්තවුන්ට නොහොත් නිර්ධනයන්ට, මිතුරු නෑකෙනෙක්, මිත්‍රකෙනෙක් ඥාතිකෙනෙක්; කවුරු, කවුරුද?

33 සු ග ත් බණ ඇසූ සව් සතුනි නැනව න
අ න ත් කිරීමට නොපෙ සිතෙහි ඇත නැ න
ඇතොත් මදක්වත් පර වැඩටත් එසි න
ක අ ත් සැපත් නොවේද මොක්පුර සැප න

33 සුගත් බණ ඇසූ, බුදුබණ ඇසූවාවූ; නැණවත, ඥානවන්තවූ; සව් සතුනි, සියලු සත්වයිනි; අනත් කිරීමට, අනර්ථ කිරීම පිණිස; නොපෙ සිතෙහි, නොපෙයේ සිත්හි; නැන, උත්සාහය; ඇත, ඇත්තේය; එසින, ඒ (උත්සාහ) චිත්තය; පර වැඩටත්, අනුන්ටවැඩපිණිසත්; මදක්වත්, ස්වල්පයක්වත්; ඇතොත්, ඇත්තේනම්;

මොක්පුර සැපත, ජීවත්පුර සැපත; කඅත් සැපත් නොවේද, කාගේ ඇසන ප්‍රාප්ත නොවේද.

34 බ ලැ ත් තවුන් හට බන් වෙරෙහි නොනැව ත
වි ප ත් පැමිණියත් ඉන් කිසි නිගා නැ ත
ම හ ත් විදුරු ගිරි බිතකට වැද අනු ත
සු න ත් දළ ඇතුට ලොවැ අපහසක් නැ ත

34 මහත්, මහත්වූ; විදුරුගිරි බිතකට, වජ්‍රපර්වතමයවූ භිත්තියකට; වැද අනුත, වැදී ඇන්නකල්හි; දළ සුනත්, දත් සිඳුන නමුත්; ඇතුට, ඇතාට; ලොවැ, ලෝකයෙහි; අපහසක් නැත, අපහාසයක් නැත්තේය; (එමෙන්) නොනැවත, නොනැවති; බල ඇත්තවුන් හට, බල ඇත්තාවුන්ට; බන් වෙරෙහි, බඳිනලද වෛරෙහිද්; විපත් පැමිණියත්, විපත්ති පැමුණුනේ නමුත්; ඉන්, එයින්; කිසි නිගා නැත, කිසි නින්දාවක් නැත්තේය.

35 න පු රු කලට සතහට පැමිණෙන වෙහෙ ස
එ දු රු නොවෙයි කල පව් පලදෙවා මි ස
ත ඹු රු වනය මුකුලිත වන බව සව ස
ක වු රු විසින් වැලකිය හැකි මෙදිය කු ස

35 සවස, සවස් වේලෙහි; තඹුරු වනය, නෙලුම් වනය; මුකුලිතවන බව, හැකිලීම වන බව; මෙදියකුස, මේ ලෝක කුක්ෂියෙහි; කවුරු විසින්, කවුරුන් විසින්; වැලකිය හැකි, වැලැක්විය හැකිවනු ලැබේද; (නොලැබේමය) (එමෙන්) නපුරු කලට, නපුරු කාලයට; සතහට, සත්වයාහට; වෙහෙස, විහිංසනයක්; පැමිණෙන, පැමිණිකල්හි; කල පව්, කරණලද පාපය; පලදෙවා මිස, විපාක දෙවා මිසක්; එ, ඒවෙහෙසය; දුරුනොවෙයි, දුරිභූතනොවෙයි.

36 ක ර ද ර දුදන පිරිසිඳැ දතුවද සත ර
ගොරත ර සපුන් විලසින් කටමිණි ලක ර
න ර ව ර සඳුන් තුර වලදිමිනි හැම ව ර
ප ර ණ ට විසම මිස අම දෙති කවර ව ර

36 කරදර, කෲර භාවය දරන්නාවූ; දුදන, දුර්ජනයෝ; සතර, ශාස්ත්‍ර; පිරිසිඳැ, නිශ්චයකොට; දතුවද, දැනගත් නමුත්; කටමිණිලකර, කණ්ඨමාණික්‍යයෙන් අලංකාරවූ; ගොරතර, ඝොරතරවූ; සපුන් විලසින්, සර්පයන්මෙන්; නරවර සඳුන්තුර, රජ නැමති සඳුන් වෘක්ෂය; වලදිමිනි, වැලදගණිමින්; හැමවර, හැමකල්හි; පරණට, අන්‍යයන්ට; විසම මිස, විෂයක්ම මිසක්; කවරවර, කවර කාලයක; අම දෙති, අමෘතයක් දෙත්ද (නොදෙත්මය.)

37 උදක් සමින් පිඹුලු පමණින් බැර ම
පසක් ලොහොම දූ අළුවෙසි වෙන වෙන ම
දූකක් පැමිණි ගුණවත් දන ලූ සුසු ම
වගක් නසනු විසිතුරුකොට කියනු කි ම

37 උදක්, තනිකර; බැරම, බොහෝකොටම; සමින්, මයිනහමින්; පිඹුලු පමණින්, පිඹුරුවාවූ පමණකින්; පසක් ලොහොම, පස්ව ලොහොසම; වෙන වෙනම, වෙන්වෙන්වම; දූ, දුනුව; අළුවෙසි, හස්මවෙසි; (එමෙන්) දූකක් පැමිණි, දුකක් පැමුණුනාවූ; ගුණවත් දන, ගුණවන්ත ජනයා; ලූ සුසුම, ලන ලද සුස්මය විසින්; වගක් නසනු, වගින් නසන බව; විසිතුරුකොට, විචිත්‍රකොට තොහොත් විශතරකොට; කියනු කිම, කියනුම කිමිද?

38 තුල සිය දිවි පුරුදුවී විසුවත් නොම ද
දූල ගුණ සුදනන්ගෙ නොදනිති දනෝ ද ද
විල වැඩි මැඩිහු නොදනිති පියුමෙහි සුව ද
වල බිඟු එ මුව රද ගෙණෑ මත්වැ දෙති න ද

38 තොවද, බොහෝසෙයින්; සිය දිවි තුල, තමාගේ ජීවිතයමෙන්; පුරුදුවී, පුරුදුව; විසුවත්, වාසයකලත්; දද, මෝඩවූ; දනෝ, ජනයෝ; සුදනන්ගෙ, සත්පුරුෂයන්ගේ; දූලගුණ, දීප්තිමත් ගුණය; නොදනිති, නොදන්නේය; (ඒ බව මෙන්ස්ය) විලවැඩී, විලෙහි වැඩුනාවූ; මැඩිහු, මැඩියෝ; පියුමෙහි, පද්මයෙහි; සුවද, සුගන්ධය; නොදනිති, නොදනිත්ත; වල, වනයෙහි; බිඟු, භෘඞ්ගයෝ, එමුවරද, ඒ මල්පැනි; ගෙණෑ, ගැරගෙණ; මත්වැ, මත්ව; නද, නාදය; දෙති, දෙත්ය.

39 කුරිරු ඝොර සපුන්ගේ දළ ගෙ හි විසය
මදුරු මැසි කැලන්ගේ තුඩ ගෙ හි විසය
රුදුරු නුහුසුවන් නැමි වල ගෙ හි විසය
නපුරු දුදනන්ගෙ සියොල ගෙ හිම විසය

39 කුරිරු, කෲරවූ; ඝොර, ඝොරවූ; සපුන්ගේ, සර්පයන්ගේ; දළගෙහි දළ අග; විසය, විසඇත්තේය; මදුරු මැසි කැලන්ගේ, මදුරු මැසි සමූහයන්ගේ; තුඩගෙහි, තුඩ අග; විසය, විසඇත්තේය; රුදුරු, රෞද්‍රවූ; නුහුසුවන්, තෝනුස්සන්ගේ; නැමි, නැමුනාවූ; වලගෙහි, වලිගයෙයි; විසය, විස ඇත්තේය; නපුරුදුදනන්ගෙ, නපුරු දුර්ජනයන්ගේ; (එසේ නොවෙයි) සියොලගෙහිම සියලු ශරීරයෙහිම; විසය, විසඇත්තේය.

40 පරසිදු පබුදනන් සෙව් පමණින් මහ රු
බෙලෙනිදු මදබුවත් නොකෙරෙති රුපුන් ස රු
බරනිදු ගෙලෙ වසන නාරද වෙමින් ග රු
ගුරුලිදු අනිත් ඇසි කිම යහලු නොරතු රු

40 බරනිඳු, ඊශ්වරයාගේ; හෙළෙ, ශ්‍රීවෙසි; (බෙල්ලේ) වසන, වාසයකරන් නාවූ; නාරද, සාගරජතෙමේ; ගරුළුවමින්, ගර්වවෙමින්; (ආඩම්බර වෙමින්) ගුරුළිඳු අනින්, ගුරුළු රජුහු කෙරෙන්; යහළුව, මිත්‍රය; නොගැරතුරුකිව, නොර තුරු කිමැයි; ඇයි, ඇසුවේය; (එමෙන්) මහරු, පූජ්‍යවූ; පරසිඳු, ප්‍රසිද්ධවූ, පබු දනන්, ප්‍රධාන ජනයන්; සෙබුපමණින්, සෞවනයකාල ප්‍රමාණයකින්; බෙලෙනිඳු, බලයෙන්ද; මදබූවන්, මදබුයේ නමුය; රුපුන්, සතුරන්; සරුනොනොකෙරෙති, සැලකීම් නොකෙරෙත්ය.

41 සතතින් පවන් අවකොල බුදින තවස ර
දැහැනින් මිදෙත් දුට ලෙලදෙන ළිය තඹ ර
බුදිමින් ගමෙක් කිරි තෙල් දී රස අහ ර්
ඉඳුරන් දමන සිදු ඉපිලෙව් මදර ගි ර

41 සතතින්, නිරන්තරයෙන්; පවන්, සුළඟින්; කොල, පත්‍රයන්; අව, ආහාර කොට; බුදින, අනුභවකරන්නාවූ; තවසර, තපොවාරීහු; ලෙලදෙන, ලීලාඋප තවන්නාවූ; ළියතඹර, නාරිලතා පුෂ්පයන්; ( ස්ත්‍රී විලාස මල් විශේෂයෙක් ) දුට, දැකීමය කලහොත්; දැහැනින්, ධ්‍යානයෙන්; මිදෙත්, පහවෙත්; ( එසේ හෙයින් ) ගමෙක්, ගව්කෙනෙක්; කිරි තෙල් දී, කිරිද තෙල්ද දීකිරිද සහිතවූ; රස අහර, රස ආහාරයන්; බුදිමින්, අනුභවකරමින්; ඉඳුරන්, ඉන්ද්‍රියයන්; දමන, දමනය කෙළොත්; (එය) මදරගිර, මහමෙරුව; සිදු, සමුද්‍රයෙහි; ඉපිලී, එවි, ඉල්පුනාක්මෙනි.

42 කුසඔත සිය සොහොවුරු වුවද තම හ ට
හිත නැත යෙහෙ දුරුකල පොකුරඹ ලෙස ට
තමගත වා පිත් සෙම් කිපෙනුය මර ට
වනගත ඔසු වග හිතවෙයි සුවපත ට

42 තමගත, තමාගේ ශරීරය සම්බන්ධවූ; වා පිත් සෙම්, වාත පිත්ත ශ්ලේෂ්මාවෝ; මරට, මරණය පිණිස; කිපෙනුය, කිපෙන්නාහුය; සුවපතට, සුවපත් විමට; වනගත ඔසු, වනාන්තරගත ඖෂධ වර්ග; හිතවේයි, හිතවේය; (එසේ හෙයින් ) කුසඔත, කුසයෙහි ඔපනාවූ; සිය සොහොවුරුවුවද, තමාගේ සහෝදරයාවූවත්; තමහට, තමාට; හිතනැත, හිත නැත්තේනම්; පොකුරඹ ලෙසට, නෙලුම්පතෙහි දියක් මෙන්; දුරුකල, දුරුකලහොත්; යෙහෙ, යහපත.

43 පර සතු දෙයක් උදුරණ ලෙසට නරු ලො ල
වෙර දුදනයන් පැවසූ නෙක බොරු තෙපු ල
තිර සර මහතුන්ගෙ සිතැ නොරඳයි නිම ල
සුර තුර විමන වෙද රිටුනට සවර ක ල

43 කවරකල, කවරකලක්හි; සුරතුර, දිව්‍ය වෘක්ෂය; රිටුනට, කපුටුවන්ට, විමනවෙද, විමානයවේද (නොවේමය එමෙන්) පරසතු දෙයක්, අනුන්සතුකා

දෙයක්; උදුරණ ලෙසට, උදුරාගන්නා ලෙසට; ලොලකර, ලොභය කොට; වෛරදුදනයන්, වෛරී දුර්ජනයන්; පැවසූ, කීවාවූ; නොක බොරු නෙපුල, අනෙක බොරු වචන; සිරසර, ක්ෂීරසාරවූ; මහතුන්ගේ, මහාත්මයන්ගේ; නිමල, නිර්මලවූ; සිතැ, සිත්හි; නොරදයි, නොරදන්නේ ( වෙ ) යි.

44 ස ත් ගුණයුත් සතන්හට වැඩ කලොත් ස රු
අ ත් පිට දියුණු වම එම කෙරෙති නිරතු රු
ච ත් කලදිය නෙරළුතුරු මුලට පියක රු
දෙ ත් මුදුනාසෙන් දරමින් රැගෙණැ අමයු රු

44 පියකරු, ප්‍රිය කරවූ; නෙරළුතුරු මුලට, නාලිකේර (පොල්) වෘක්ෂමූලයට; චත්කල දිය, වත්කරණලද ජලය; රැගෙණැ, හැරගෙණ; මුදුනයෙන්, මුදුනෙන්; දරමින්, ධාරණයකරමින්; අමයුරු, අමෘතයක් සේ; දෙත්, දෙති; (එමෙන්) සරු, සාරවූ; සත්ගුණයුත්, යහපත් ගුණයෙන් යුක්තවූ; සතන්හට, සත්වයන්ට; වැඩකලොත්, වැඩ කලහොත්; එම, එයම; නිරතුරු, නිරන්තරයෙන්; අත්පිට, ඉදිරිපිට; දියුණුවම, දෙගුණයක්වම; කෙරෙති, කෙරෙත්ය.

45 නැණැති දනන්හට මද ගුණයක් කළ ද
ප ව ති ගලකෙටූ අකුරක් මෙන් නිබ ද
වි ම ති දනන්හට කල කිසි ගුණ නොම ද
එ නැ ති වේය දිය පිට ඇඳි ඉරක් ලෙ ද

45 නැණැති දනන්හට, ඥානවන්ත ජනයන්හට; මද ගුණයක්, ස්වල්ප ගුණයක්; කළද, කළහොත්; ගලැකෙටූ, ගලෙහි කෙටුවාවූ; අකුරක්මෙන්, අක්ෂරයක්මෙන්; නිබද, නිරන්තරයෙන්; පවතී, පවතිය; විමති දනන්හට, අඥවන ජනයන්ට; නොමද, බොහෝවූ; කිසිගුණ, කිසිගුණයක්; කල, කලහොත්, ඒ, එය; දියපිට, ජලමතුයෙහි; ඇඳි, ඇන්දාවූ; ඉරක්ලෙද, රේඛාවක්මෙන්; නැතිවේය, නැතිවෙයි.

46 අ මි ත ගුණ නුවන යුතු උතුමෝ පබ ද
අ න ත වෙහෙස ලදුවත් නොම වෙති දුහ ද
දි ග ත පතල සුවඳැති සොඳ සඳුන් ක ද
සි දි ත මඩිත එක ලෙස පැතිරෙයි සුව ද

46 දිගත පතල, දිගන්තරයෙහි පතලාවූ; සුවඳැති, සුවඳ ඇත්තාවූ; සොඳ, යහපත්වූ; සඳුන් කද, හඳුන් කද; සිඳිත, කපනකල්හිද; මඩිත, පොඩිකරණකල්හිද; එකලෙස, එකාකාරයෙන්; සුවද, සුගන්ධය; පැතිරෙයි, පැතිරීයෙයි; ( එමෙන් ) අමිත, අප්‍රමාණවූ; ගුණ නුවනයුතු, ගුණයෙන්හා ඥානයෙන් යුක්තවූ; පබද, ප්‍රසිද්ධවූ; උතුමෝ, උත්තමයෝ; අනත වෙහෙස ලදුවත්, අනන්ත වෙහෙස ලදනුමුත්; දුහද නොවෙති, දුෂ්ඨසිත් ඇත්තවුන් නොවෙත්ය.

47 බුදුන් දහම් සඟනට නොකලෙම් අද ර
නිවන් දකින පිණකුත් නොකළෙම් පව ර
ලියන් තන නොසිපියෙමි සිහිනෙන් විත ර
උපන් නෙ මයොවුන් වනයට පොරව සු ර

47 බුදුන් දහම් සඟනට, බුද්ධ ධර්ම සඞ්ඝයන්ට; අදර, ආදරය; නොකලෙම්, නොකලෙමිය; පවර, උතුම්වූ; නිවන් දකින, නිවන් දැකීමට නිසිවූ; පිණකුත්, පුණ්‍යයකුත්; නොකළෙම්, නොකළෙමිය; ලියන්තන, ස්ත්‍රීන්ගේ පයොධර යත්; සිහිනෙන්විතර, සිහිනෙන් පමණවත්; නොසිපියෙමි, වැළඳ නොගත්තෙමි; (එසේකල) මයොවුන් වනයට, මවගේ යොවුනා නැමති වනයට; පොරවසුර, පොරවස්සේ; උපන්නෙ, උපන්නෙකෙනෙක් (මෙමි) ය.

48 නොම දත් සතෙක් ගැඹරින් යුත් පද සත ර
පදරුත් වියකම්සි සලකණු සබය තු ර
මදමත් තුඟු මහත් වන ගිජ්දෙකු ලත ර
සියපත් නල හුයින් බඳිනෙවු කරණ වැ ර

48 ගැඹරින්යුත්, ගම්භීරයෙන් යුක්තවූ; පදසතර, පදශාස්ත්‍රය (නොමනාත් නාමය ක්‍රියාය උපසර්ගය නිපාතය යන සතර පදය;) නොමදත්, නොදන්නාවූ; සතෙක්, සත්වයෙකු විසින්; සබය තුර, සභාව අතරෙහි; පදරුත්, පද අර්ථයන්; වියකම්සි, කියම්සි; සලකණු, කල්පනා කිරීම; (කෙබඳුද) මදමත්, මදයෙන් මත්වූ; තුඟු, උස්වූ; මහත්, මහත්වූ; ලතර, සිත්දුසිවූ; වනගිජ්දෙකු, වනහස්ති රාජයෙකු; සියපත් නල හුයින්, නෙළුම් දණ්ඩෙහි හුලෙන්; බඳිනු, බැඳීමට; වැරකරණුවි, වියත් කරන්නාක් මෙනි.

49 කොතෙක් ගුණ කළත් දුදනන් හට අසු බ
අකක් පමණවත් නොකරෙති පිරිය ලො බ
එළක් රසෙහි සැදුවත් නිඹ බිජු කිර ඹ
උදක් තිත්තමය ගැබ පස තුරෙහි නි ඹ

49 එළක් රසෙහි, ඒ උක්රසයෙහි; කිරඹ, කිරිවතුරෙන්; නිඹ බිජු, කොසඹ ඇටය; සැදුවත්, සැදුනුමුත් හෙවත් පැලකළ නුමුත්; නිඹතුරෙහි, කොසඹ ගසෙහි; ගැබපස, ඇතුල් පාශ්වය; උදක් තිත්තමය, තනිකර තිත්තමය; (එමෙන්) අසුබ, අයහපත්වූ; දුදනන්හට, දුර්ජනයන්ට; කොතෙක් ගුණකළත්, කොපමණ ගුණකළ නුමුත්; අකක් පමණවත්, මදටිය දෙකහමාරක් පමණ වත්; පිරියලොබ, ප්‍රිති ලොභයක්; නොකෙරෙති, නොකෙරෙත්ය.

50 ස ඳු න් කපුරු සමඟින් පිනිඳිය නොම ද
සොඳින් කලල් කෙරෙමින් සුවඳ මුව ම ද
නි ති න් හිමඹ ඉසැ ඉසැ * ලුහුනු වැවුව ද
ත ම න් ගුණය නොහරින වැනි දුදන හ ද

50 දුදන, දුර්ජනයාගේ; හද, හෘදය; (කෙසේද) නොමද, බොහෝවූ; පිනි ඳිය සමඟින්, පිනිදියර සමග; සඳුන් කපුරු, සඳුන්ද කපුරුද; සුවඳ මුවමද, සුවඳ ඇත්තාවූ කස්තූරිද; සොඳින්, යහපත් ලෙසින්; කලල් කෙරෙමින්, මඩකර මින්; නිතින්, නිරන්තරයෙන්; හිමඹ, පිනිදිය; ඉසැ ඉසැ, ඉසීම කොට කොට; ලුහුනු, ලූනු; වැව්වද, වැවූනුමුත්; තමන්, තමන්ගේ; ගුණය, ඇත්තාවූ ගුණය; නොහැරිත වැනි, නොහරින්නාක්මෙනි.

51 ස ම ගි න දුදන සත සහ වනු බඳිනු වෙ ර
නොසෙදෙන කාරුණ්‍යමය සුදනන් හට පව ර
ගි නි ගෙ ණ දිලි අඟුරු ගත්කලැ දවයි ක ර
නි ව් හැ න රැගත්හොත් කළුවේය නොවිත ර

51 දුදන සත සමඟින, දුර්ජන සත්වයා සමඟින්; සහවනු, සහල්වීමද; වෛර බඳිනු, වෛරය බැඳීමද; පවර, උතුම්වූ; සුදනන් හට, සත්පුරුෂයන්ට; නො සෙදෙන කරුණුමය, නොවෙයදීනයුතු කාරණාමය; හෙවත් නුසුදුසු කාරණාමය; ගිනිගෙන දිලි, ගිනිගෙණ දිලිසෙගත්තාවූ; අඟුරු ගත්කලැ, අඟුරුගත් කල්හි; කර දවයි, අතදවයි; නිව්හැන, නිවුන කල්හි; රැගත්හොත්, හැරගත හොත්; නොඑතර, පමණක් නැතිසේ; කළුවේය, කළුවෙයි.

52 ප ත ර දුදන අනදර සුදන අදර ද
අ ව ර දිනිඳුසේ ලෙස වැඩිවෙයි නිබ ද
අ ද ර අනදරද පිළිවෙළ නොවන් හ ද
ල ගි ර සේ වැන්න අඩුවන මදින් ම ද

52 පතර, මහත්වූ; දුදන, දුර්ජනයාගේ; අනදර, අනාදරයද; සුදන, සත්පුරුෂ යාගේ; අදරද, ආදරයද; අවර දිනිඳුසේ ලෙස, අවරට ගිය සූර්‍ය්‍යයා ඇතිකල්හි ඡායාවමෙන්; නිබද, නිරන්තරයෙන්; වැඩිවෙයි, වැඩීමවෙයි; හද නොවන්, (දුර්ජනයන්ගේ හා සත්පුරුෂයන්ගේ) හෘදයෙහි නොවන්නාවූ; අදර අනදර, ආදරය සහ අනාදරයාගේ; පිළිවෙළද, පිළිවෙළත්; මදින්මද, මදමදින්; අඩුවන, අඩුවන් නාවූ; ලගිර, බාල සූර්‍ය්‍යයාගේ; සේවැන්න, ඡායාවමෙනි.

---

* සමහර පොතකත්හි ලුණු වැවූවද කියා තිබෙයි ලුණුනම් ලවණයි.

53 ත ම න් හට නොසමයන්වන කලට ස ම
මු වෙ න් නොබැනැ ඉවසනු සුදන ගරු ක ම
නොමි න් කුමුදු වන විකසිත වනු දැක ම
වි ළි න් මෙන් තඹුරු මුකුලිත වේය හැ ම

53 කුමුදුවන, කුමුදු වනය; නොමින්, බොහෝසෙයින්; විකසිතවනු, පුබුදුවීම; දැකම, දශිතයකොටම; විළිත්මෙන්, ලජ්ජාවෙන් මෙන්; තඹුරු හැම, නෙළුම් මල් සියල්ල: මුකුලිතවේය, හැකිලෙයි; (එමෙන්) තමන්හට, තමන්ට; නොසම යන්, සමනුවූවන්; සමවනකලට, සමානවන කල්හි; සුදන, සත්පුරුෂයා විසින්; මුවෙන්, මුඛයෙන්; නොබැනැ, කථානොකොට; ඉවසනු, ඉවසනබව; ගරුකම, ගරුකමෙකි.

54 මි නි ස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇ ත
නි දෙ ස් කෙනෙක් මෙදියත උපදනේ නැ ත
වෙ සෙ ස් සිනිඳු මුවරද බර සහස් ප ත
කොරොස් නලින් යුතුවෙයි කටු පෙල දිමු ත

54 වෙසෙස්, උතුම්වූ; සිනිඳු, සිනිදුවූ; මුවරද බර, මකරන්දයෙන් (මල් පැනියෙන්) භාරවූ; සහස් පත, නෙළුම් මල; කටුපෙලදිමුත, කටුපෙලින් දිළිහෙන්නාවූ; කොරොස් නලින්, කොරසැඹි දණ්ඩකින්; යුතුවෙයි, යුක්තවෙයි; (එමෙන්) මිනිස්හට, මනුෂ්‍යයාට; සොඳුරු ගුණ සහ, යහපත් ගුණය හා; නුගුණ, අගුණ යද; ඇත, ඇත්තේය; නිදෙස් කෙනෙක්, නිර්දෝෂ කෙනෙක්; මෙදියත, මේ ලොකයෙහි; උපදනේ නැත, උපදිනුයේ නැත්තේය.

55 සි ත මි න් උඩඟුබව සතොකුට නම කෙරෙ ති
සැප ති න් ඉදිමි සලකා නෙක දුක් විඳි ති
ප ත මි න් දිවිරැකුම් රණ මැද වැද නැසෙ ති
එ බැ වි න් සෙබළු වැනි දද දන වෙනින් නැ ති

55 උඩඟු බව, උඩඟු භාවය; සිතමින්, චින්තනයකරමින්; සතොකුට, සතුටෙය කුට; නමකෙරෙති, නමස්කාර කෙරෙත්ය; සැපතින් ඉදිම්, සැපයෙන් ඉදිමී සී; සලකා, කල්පනාකොට; නෙකදුක්, නොයෙක් දුක්, විඳිති, විඳිත්ය; දිවිරැකුම්, ජීවිත රක්ෂාව; පතමින්, ප්‍රාර්ථනා කෙරෙමින්; රණමැද වැද, යුධ මධ්‍යයට වැද්; නැසෙති, නැසෙත්ය; එබැවින්, එසේ හෙයින්; සෙබළුවැනි, සේවා භටයන් වැනිවූ; දද දන, අඥානයෝ; වෙනින් නැති, වෙනින් නැත්තාහුය.

56 කු ල යෙ න් හුනු දනෝ මහතුන් සෙවුම් කො ට
ඉ සු රෙ න් යුතුවැ පැමිණෙත් ගරු තනතුර ට
වෙසෙ සි න් කුසුම් ගෙතුමෙන් සුමුසු රඹ ප ට
සතො සි න් සැපත්වෙයි නිරිඳුන් මුදුනත ට

56 වෙසෙසින්, විශෙෂයෙන්; කුසුම් ගෙතුමෙන්, මල් ගෙතීමෙන්; සුමුසු, යහපත්සේ මිශ්‍රවූ; රඹපට, කෙසෙල් පට්ටය; නිරිඳුන්, රජුන්ගේ; මුදුනතට, හිසට

සන්තොෂින්, සන්තොෂයෙන්; සැපත්වෙයි, පැමිණෙයි, (එමෙන්) කුලයෙන් යුතු, වංශයෙන් අඩුවූ; දනෝ, ජනයෝ; මහතුන්, මහත්මයන්; සෑවූ විකොට, සෙවනය කොට; ඉසුරෙන්, ඓශ්වර්ය්‍යයෙන්; යුතුවූ, යුක්තවූ; ගරු තනතුරට, ගරු කට යුතු ස්ථානන්තරයට; පැමිණෙත්, ප්‍රාප්තවෙත්‍ය.

57 ප බ ඳ පබුද කිවිඳුද යුදෙහි සෙබළු ද
පැහැ ද සුරති කෙළිනා වර වරඟන ද
කි ව ද තො තා යන බස් පෙරදූරි දුහ ද
ව ර ද නොවැ අසත් නිරිඳෝ වඩමි නො ද

57 පබඳ, ප්‍රසිඩවූ; පබුද, ප්‍රධානීන්ද; කිවිදුද, කවීන්ද්‍රයන්ද; යුදෙහි, යුධයෙහි; සෙබළුද, සේවා භටයන්ද; පැහැද, ප්‍රශන්තව; සුරති කෙළිනා වර, සුරති ක්‍රීඩා කරණ කල්හි; වරඟනද, වරාඞ්ගනාවන්ද; දුහද පෙරදූරි, දුෂ්‍යසිත් පෙරදූරිව; තො තා යන බස්, තෝය තාය යන වචන; කිවද. කිවූනමුත්; නිරිඳෝ, නරේන්ද්‍රයෝ; වරද නොව, විරුඩ නොව; හෙවත් වරදනැයි නලපනානොකොට; ඔද වඩවමින්, සන්තොෂ වඩවමින්; අසත්, අසත්‍ය.

58 සු ද න ගුණෙන් යුතු උතුමන්ගෙ පිය ක රු
අ බි ම න කි න් වූ රොස නොකල හැකි දු රු
සිහිල ගු ණෙ න් යුතු දියදහර පිවිතු රු
මි පි ම ග කි න් යන කලැ නවතති කවු රු

58 පිවිතුරු, පවිත්‍රවූ; සිහිල ගුණෙන් යුතු, සීතල ගුණයෙන් යුක්තවූ; දිය දහර, ජලධාරාව; මිපිමගකින්, මිප්වූ මාර්ගයකින්; යනකල, යනකල්හි; කවුරු, කවර තැනත්තෝ; නවතති, නවතත්ද; (නැවැත්විය නොහැකිවෙති එමෙන්) සුදන ගුණෙන් යුතු, සත්පුරුෂ ගුණයෙන් යුක්තවූ; පියකරු, ප්‍රියකරුවූ; උතුමන්ගේ, උත්තමයන්ගේ; අභිමනකින්, කිසිනැමැත්තකින්; වූරොස, වූවාවූ රොසය; දුරු නොකළහැකි, දුරු නොකළහැක්කේයි.

59 සු ර පු ර සැප සපයන පින් නොම කෙරෙ ති
අ ර න ර අව බියදෙන පවම කර ල ති
පැණස ර නුවු ලොවැ නරයන්ගේ සිරි ති
කිරිහැ ර මර එලවන ගොර විසම බො ති

59 සුරපුර සැප, දිව්‍යපුර සම්පත්තිය; සපයන, ලබාදෙන්නාවූ; පින්, පුණ්‍යය; නොමකෙරෙති, නොකෙරෙත්ය; අරනර, අධිකතරවූ; අවබිය, අපාය භීතිය; දෙන, දෙන්නාවූ; පවම, පාපයම; කරලති, කරලත්ය; ලොවැ, ලොකයෙහි; පැණසර නුවු, ප්‍රඥාසාර නුවූ; නරයන්ගේ, මනුෂ්‍යයන්ගේ; සිරිති, චාරිත්‍රයකි; කිරි හැර, කිරි අත්හැර, මර එලවන, මරණය පමුණුවන්නාවූ; ගොර විසම, ඝොර විසම; බොති, බොත්ය.

60 ලො වි න් එකෙක් එකදේකට වේ යම් ත
වෙ න් න් අනික් දේකට අනිකෙක් සම ත
නො මි න් සුලභ ලදුවත් තද ගිම් සැප ත
ගො ඩි න් නැව දියෙන් රතයද නොයනු යු ත

60 ලොවින්, ලොකයෙන්; එකෙක්, එක් තැනැත්තෙක්; එකදේකට, එකම දෙයකට; සමතවේ, සමර්ථවේයි; අනිකෙක්, අනික් තැනැත්තෙක්; වෙනින් අනික් දේකට, වෙනින් අන්‍ය දෙයකට; සමත, සමර්ථය; (කෙසේද) නොමින්, බොහෝසෙයින්; සුලභ, විතය; ලදුවත්, ලද්දේවී නමුත්; තදගිම්, තද ග්‍රීෂ්මය; සැපත, සම්ප්‍රාප්තවූයේ නමුත්; ගොඩින් නැව. ගොඩින් නැවද; දියෙන් රතයද, ජලයෙන් රථයද; නොයනු යුත, නොයන්නාක්මෙනි.

61 මු දු ව ට සිනිදු වෙඬරුද සුදනන් හද ද
සරිකො ට කිවත් කිවි දන නොමවෙයි එලෙ ද
ප ර ණ ට තැවුල් වත උණුවෙයි සුදන හ ද
එලෙ ස ට උණු නොවෙයි එබැවින් වෙඬරු ත ද

61 මුදුවට, මෘදුව පවත්නාවූ; සිනිඳු, සිනිඳුවූ; වෙඬරුද, වෙඬරුද; සුදනන් හදද, සත්පුරුෂයන්ගේ හෘදයද; කිවිදන, කවිජනයා විසින්; සරිකොට, සදෘශකොට; කිවත්, කියනලදහුමුත්; එලෙද නොමවෙයි, එලෙස නොවෙයි; පරණට, අන්‍යයන්ට; තැවුල් වත, තැවිලීක්වූ කල්හි; සුදන හද, සත්පුරුෂයන්ගේ හෘදය; උණුවෙයි, උණුවේය; එලෙසට, එ ආකාරයට; උණු නොවෙයි, (වෙඬරු) උණු නොවේය; එබැවින්, එසේ හෙයින්; වෙඬරු තද, වෙඬරු තදී.

62 නොහිම් සුවඳ විහිදෙන කාස්තුරි නිම ල
උ තු ම් මුව නැබෙහි තිබි බඹ නැන වික ල
වි න ම් මෙ මට මහබඹු පදවි යම් ක ල
ත බ ම් බොරු කියන දුදනන්ගෙ දිව මු ල

62 නොහිම්, ඉමක් නැත්තාවූ; සුවද විහිදෙන, සුගන්ධය විහිදෙන්නාවූ; නිමල, නිර්මලවූ; කාස්තුරි, කාස්තුරිය; බඹ, බ්‍රහ්මතෙම; නැන විකල, ඥාන විකලයෙන්; උතුම්, උත්තමවූ; මුව, මුවන්ගේ; නැබෙහි, නාභියෙහි; තිබි, තිබිය; මෙමට, මේ මට; මහබඹු පදවි, මහාබ්‍රහ්ම තනතුර; යම්කල, යම්කාලයක්හි; විනම්, වූයේ නම්; බොරු කියන, බොරු කියන්නාවූ; දුදනන්ගෙ, දුර්ජනයන්ගේ; දිවමුල, දිව මුලෙහි; තබම, තබමි.

63 අ බ ර ණ සමග සිපි පිරිවරද තම වෙ ත
නොදර ණ තැනැ යෙදුවහොත් නොමවේ දිමු ත
කොපම ණ රජ ඉසුරු ලදුවත් මුළු දිය ත
සි ළු මි ණ සරණ බඳහොත් අපහස කර ත

63 මුළුදියත, සියලු ලොකයෙහි; රජ ඉසුරු, රාජ ඓශ්වර්යය; කොපමණ, කොපමණක් ප්‍රමාණ; ලදුවත්, ලදනමුත්; සිළුමිණ, සිඛාමාණික්‍යය; සරණ, චරණයෙහි;

(පසේ) බඳහොත්, බන්ධනය කළහොත්; අපහසකරන, අපහාසකරන්නය; (එමෙන්) නමවන, නමන්සම්පයෙහි; අබරණ සමග, ආභරණ සහිතව; සිව්, සිව්නාවූ; පිරිවරද, පිරිවර ජනයාද; යොදරණ තැනැ, දරා නොසිටිනානන්හි; හෙවත් දැරිය නොහැකි තැනතුරෙහි; යෙදුවහොත්, යෙදුවෙහි නම්; දිමුත නොමවේ, දිප්තිමත් නොවෙයි.

64 නොවිත ර   තෙද බලැති මහතුන් හට පව   ර
වැ ර සැ ර   මද නුවන මද දන බඳිනු වෙ   ර
තු ඟු ත ර   ගිරි පුලන දළ දළහින් පැහැ   ර
ම ත ව ර   ණිදුට පෙදෙනැනැ වෙහෙසෙන අසු   ර

64 නොවිතර, අප්‍රමාණවූ; තෙදබලැති, තෙජ බලඇත්තාවූ; පවර, උතුම්වූ; මහතුන්හට, මහත්මයන්ට; වැරසැර මද, වීරසාරමද්වූ; නුවන මද, ඥානය මද්වූ; දන, ජනයා විසින්; වෙර, වෛරය; බඳිනු, බැඳීම; (කෙසේද) තුඟු, උස්වූ; තර, මහත්වූ; ගිරි, පර්වතයන්; දළ දළහින්, මහත්වූ දත් අගින්; පැහැර, ප්‍රහාරණය කොට; උපුලන, උදුරණනාවූ; මතවරණිදුට, මත්ත හස්තිරාජයාට; පෙදෙන් පාදයෙන්; ඇනැ, ප්‍රහාරණයකොට හෙවත් ඇනලා; වෙහෙසෙන අසුර, වෙහෙසෙන්නාක්මෙනි.

65 තිර ස ර   ගුණෙන් යුතු උතුමෙකු හට පව   ර
ස මු දු ර   සියල් කිඳලෙක තුඹසෙක සුනෙ   ර
පු ව ත ර   මෙ දඹදිව මළුවෙක සිය ගෙද   ර
ඔහු ක ර   නොවන සැපතෙක් එබැවින් කව   ර

65 පවර, උතුම්වූ; තිරසර ගුණෙන්, ස්ථිරසාර ගුණයෙන්; යුතු, යුක්තවූ; උතුමෙකුහට, උත්තමයෙකුට; සියල් සමුදුර, සියලු සමුද්‍රය; කිඳලෙක, කිඳලියක්ය; සුනෙර, මහමේරුව; තුඹසෙක, තුඹසෙක්ය; පුවතර, ප්‍රසිද්ධවූ; මෙදඹදිව, මේ ජම්බු ද්වීපය; සිය ගෙදර, තමාගේ ගෙදර; මළුවෙක, මළුවක්ය; හෙවත් මිදුලක්ය; එබැවින්, එසේ හෙයින්; ඔහු කරනොවන, ඔහු අත්නොවන්නාවූ; සැපතෙක්, සම්පත්තියෙක්; කවර, කවරේද?

66 නොපණිත්   අය අනන අහසෙවු නැත නිය   ම
එ ම හ ත්   බැවින් වනසනු නොයෙදෙත් සැවො   ම
ත ම සි ත්   තුලෙහි වෙර නැසුවොත් නොතබා   ම
වැනසෙ ත්   ඔවුන් හැම දියවන් ගිනි සේ   ම

66 නොපණිත් අය, පණිතට විරුඬව් හැසිරෙන්නාහු; අනන අහසෙව්, කෙළවරක් නැති ආකාශය මෙන්; නියම නැත, නියමයක් නැත; එමහත් බැවින්, ඔවුන් මහත් බැවින්; සැවොම, සියල්ලෝම; වනසනු, විනාශකරණු ලැබීමට; නොයෙදෙත්, නොමයෙදෙත්ය; (එසේහෙයින්) තම සිත්තුලෙහි, තමාගේ සිත අතරෙහි; වෙර, වෛරය; නොතබාම, තැබීම නොකොටම; නැසුවොත්, විනාශකළහොත්; ඔවුන් හැම, ඔවුන් සියල්ලෝම; දියවන්, ජලය පැමුණුනාවූ; ගිනි සේම, ගිනි ලෙසටම්; වැනසෙත්, විනාශවන්ය.

67 ව න ක ල  සතුන්හට සිරි සැපත මනක  ල
ක ස ප ල  තුලෙහි දිය ලොද මෙන් වෙයි විපු  ල
යන ක ල  එසිරි සම්පත් වැනසෙයි සිය  ල
ග ජ ග ල  ඇතුලැ ඔදසුන් දිවුල පල තු  ල

67 සතුන්හට, සත්වයන්ට; මනකල, මනහරවූ; සිරි සැපත, ශ්‍රී සම්පත්තිය; වනකල, වන්නාවූ කල්හි; කසපල තුලෙහි, කාසපල ඇතුලෙහි; දිය ලොද මෙන්, වතුර හා ලොද මෙන්; විපුල වෙයි, මහත්වේයි; එසිරි සම්පත්, ඒ ශ්‍රී සම්පත්තිය; යනකල, යන්නාවූ කල්හි; සියල, සියල්ල; වැනසෙයි, විනාශවේයි; (කොහේද) ගජගල, හස්තියා විසින් ගිලිනලද; ඇතුලැ, ඇතුලෙහි; ඔදසුන්, ඕජස් ශූන්‍යවූ; දිවුල පල තුල, දිවුල් ගෙඩිය වැන්න,

68 ම හ ත්  දනවතුන් ඇතිවද සුදන ගෙ  න
ගන් ත්  තමන් කටයුතු හිරිදෝ නිති  න
ඇත ත්  කෙල ගණින් රැස්කල දන නොමි  න
බ ල ත්  ලොහො දපණතල ගෙණැ තම උව  න

68 මහත් දනවතුන්, මහත්වූ ධනවත්තයන්; ඇතිවද, ඇති නමුත්; සුදන ගෙණ, සත්පුරුෂයන්ගෙන්; හිරිදෝ, තෘෂ්ණාවෝ; නිතින, නිරන්තරයෙන්; තමන් කටයුතු, තමන්ගේ කටයුතුදෙය; ගන්ත් (කර) ගනිත්ය; (කෙසේද) නොමින, බොහෝ සෙයින්; රැස්කල, රැසිකලාවූ; කෙලගණින්, කෝටිගණනින් යුක්තවූ; දන, ධනය; ඇතත්, ඇති නමුත්; ලොහො දපණතල, ලෝභ කැඩපත; ගෙණැ, හැරගෙණ; තම උවන, තමන්ගේ මුහුණ; බලත්, බලත්ය. (එමෙන්)

69 ම ද යෙ න්  මත් මතඟ කුඹුතල පිරිමඩි  ති
වි ස යෙ න්  දූඩි උරඟ උරතලෙහි පලදි  ති
මෙ ලෙසි න්  අසිරිමත් විසිතුරු සත කෙරෙ  ති
එ ම දි න්  රජුන්ටත් සේවය කරැ රැකෙ  ති

69 මදයෙන් මත්, මදයෙන් මත්වූ; මතඟ, හස්තින්ගේ; කුඹුතල, කුම්භස්ථලය; පිරිමඩිති, පිරිමඩිත්ය; විසයෙන්, විෂ කරණකොටගෙණ; දූඩි, දූඩිවූ; උරඟ, සර්පයන්; උරතලෙහි, උරස්ථලයෙහි; පලදිති, පලඳිත්ය; මෙලෙසින්, මේ ආකාරයෙන්; අසිරිමත්, ආශ්චර්යමත්වූ; විසිතුරු, විචිත්‍රයන්; සත, සත්වයෝ කෙරෙති, කෙරෙත්ය; එමදින්, ඒ මදිව; රජුන්ට්ත්, රජවරුන්ටත්; සේවයකරැ, සේවය කොට; රැකෙති, රක්‍ෂාවෙති.

70 වි හි දු  තුරු සෙනග පිරිවරයුතු නොමි  න
සි නි දු  අමා කිරණින් ලොව බබුලුව  න
න රි ඳු  දිනිඳු හමුවන නොදිලෙන බැවි  න
කෙබඳු  කෙනෙක් ලුහු නොමවෙති අන් වද  න

70 විහිදු, පැතුරුනාවූ; තුරු සෙනග පිරිවර, තාරකා පිරිවර සේනාවෙන්; යුතු, යුක්තවූ; සිනිදු, සිනිදුවූ; අමා කිරණින්, අමෘත රශ්මියෙන්; ලොව, ලෝක

ය; බබුලුවන, බබලුවන්නාවූ; නරිඳු, චන්ද්‍රයා; දීනිඳු හමුවන, සූර්‍ය්‍යා අභිමුඛවූ කල්හි; නොදිලෙන බැවින, නොදිලිහෙන බැවින්; කෙබඳු කෙනෙකක්, කොයි ආකාර කෙනෙක් නම්; අන් වදන, අන්‍ය වචනයෙහි හෙවත් අනුන්ගේ භාෂා වෙහි; ලුහු නොමවෙති, සැහැල්ලු නොවෙත්ද (සැහැල්ලු වෙත්මය).

71 ක ලු න් මද්දු සබ අබතුරු බොහොසෙ නි ති
ලෙසි න් විදුලි දිලි කගපත් ලෙල කොරෙ ති
ක ගි න් කග පහර වැදු නැගි පුලිඟු ඇ ති
ස ට න් බිමැ කගත් සෙබලෝ දුලබ වෙ ති

**71** කලුන්, ස්ත්‍රීන්ගේ; මද්දු, මධ්‍යයෙහිද; සබ අබතුරු, සභා අභ්‍යන්තරයෙහිද; නිති, නිරන්තරයෙන්; බොහෝසේ, බොහෝසෙයින්; විදුලි ලෙසින්, විදුලි මෙන්; දිලි, දිලිහෙන්නාවූ; කගපත්, ඛඩ්ගපත්‍ර; ලෙල කෙරෙති, ලීලෝපේත කෙරෙත්ය; කගින් කග, කඩුවෙන් කඩුවෙහි; පහර, ප්‍රහාරය; වැදු, වැදී; නැගි, නැංගාවූ; පුලිඟු ඇති, ගිනි පුපුරු ඇත්තාවූ; සටන් බිමැ, යුධ භූමියෙහි; කගත්, කඩු ගත්තාවූ; සෙබලෝ, සේවා භටයෝ; දුලබ වෙති, දුර්ලභවෙත්ය.

72 මෙලොවින් පරලොවින් වන අවැඩ නොම දු න
සි රි ති න් ලොවැ පැවති නැතමද බල දුද න
දෙකු ලෙන් පුත්වැ උපනත් සක කිරි ලෙසි න
කු සු මෙ න් උපන් පණුවැනි පෙර කල පවි න

**72** මෙලොවින්, මේ ලෝකයෙන්ද; පරලොවින්, පරලෝකයෙන්ද; වන, වන්නාවූ; අවැඩ, අනභිවෘද්ධිය; නොමදුන, නොදන්න; ලොව, ලෝකයෙහි; සිරිතින්, චාරිත්‍රයෙන් හෙවත් පුරුද්දෙන්; පැවති, පවත්නාවූ; නැතමද, නුවන මඳවූ; බල, බාලවූ; දුදන, දුර්ජනයෝ; සක කිරිලෙසින, ශංඛක්ෂීර මෙන්; (හක් ගෙඩියෙහි වත්කරණලද කිරිමෙන්) දෙකුලෙන්, මව් පිය දෙකුලයෙන්; පුත්වා, පුත්තව; උපනත්, උපන් නමුත්; පෙරකල පවින, පූර්වයෙහි කරණලද පාපය න්ගා; කුසුමින්, මලින්; උපන්, උපන්නාවූ; පණුවැනි, පණුවන් මෙනි.

73 නෙකවත් ඇතත් මෙතෙකැයි යන පමණ නැ ති
ලොබසිත් වෙමින් ඉල්ලනු දිළිඳුන් සිරි ති
දල නෙත් නියුතු මෙහෙසුරු පුවතර තෙදැ ති
ජ ර ප ත් මහලු ගොන් වාහනයෙන් සර ති

**73** පුවතර, ප්‍රසිද්ධවූ; තෙදැති, තේජස් ඇත්තාවූ; දලනෙත් නියුතු, තලල්හි නෙත්‍රයකින් යුක්තවූ; මෙහෙසුරු, මහේශ්වරයෝ; ජරපත්, ජරාවට පැමිණියාවූ; මහලු, වෘද්ධවූ; ගොන් වාහනයෙන්, වෘෂභ වාහනයෙන්; සරති, හැසිරෙත්ය; (එමෙන්) මෙතෙකැයි යන, මෙතෙක්ය යන; පමණ නැති, ප්‍රමාණයක් නැත්තාවූ; නෙකවත්, නොයෙක් වස්තු; ඇතත්, ඇත්තේ නමුත්; ලොබසිත් වෙමින්, ලෝභසිත් ඇතිවෙමින්; ඉල්ලනු, ඉල්ලීම; දිළිඳුන්, දරිද්‍රයන්ගේ; සිරිති, චාරිත්‍රයෙක්.

**74** සසොබන මහතුන්ටවත් නොමද ගරුත ර
දිනදින පුරුදු වීමෙන් කෙරෙති අනද ර
නොමදින සුවඳ විහිදෙන සොඳ සඳුන් හ ර
හිමවන වසන වැදි අඟනෝ කෙරෙති ද ර

**74** නොමඳින, බොහෝ සෙයින්; සුවඳ, සුගන්ධය; විහිදෙන, පැතිරෙන්නාවූ; සොඳ, යහපත්වූ; සඳුන් හර, චන්දන සාරය; (සඳුන් අරටුව) හිමවන, හිමාලය වනයෙහි; වසන, වසන්නාවූ; වැදි අඟනෝ, වැදි අඞ්ගනාවෝ; දරකෙරෙති, දරකෙරෙත්ය; (එමෙන්) නොමද ගරුතර, ඉතා බොහෝ ගරුතර යුතුවූ; සසොබන, යහපත්කමින් යුක්තවූ; මහතුන්ටවත්, මහත්මයන්ට නමුත්; දිනදින, දවස්පතා; පුරුදුවීමෙන්, පුරුදුවීම කරණකොටගෙණ; අනදර කෙරෙති, අනාදර කෙරෙත්ය.

**75** වතින් බතින් බුලතින් සියලු සැපති නි
නිතින් විදින පහසින් රස මුසු බසි නි
කතුන් සිත් ගණිමි සලෙලුන් යනු කෙවැ නි
දූලින් සුලං බඳනට නැත් කරණ මෙ නි

**75** වතින්, වස්ත්‍රයෙන්ද; බතින්, ආහාරයෙන්ද; බුලතින්, බුලතයෙන්ද; සියලු සැපතිනි, සකල සම්පත්තියෙන්ද; නිතින්, නිරන්තරයෙන්; විදින, විඳින්නාවූ; පහසින්, ස්පර්ශයෙන්ද; රසමුසු බසිනි, රස මිශ්‍ර වචනයෙන්ද යුක්තවූ; කතුන්, කාන්තාවන්ගේ; සිත්ගණිමි, සිතගණිම්ස; සලෙලුන්, සල්ලාලයන්; යනු, යන බව; කෙවැනි, කොයි ආකාරද; දූලින්, දූලකින්; සුලං, සුලඟ, බඳනට, බැඳිම පිණිස; නැත්කරණ මෙනි, උත්සාහ කරන්නාක් මෙනි.

**76** අමරසවන් අඹරස බුදිමින් සිනි ඳු
නිතිගෙළුයන් පෙදෙසෙහි සරමින් පසි ඳු
එකපැහැයෙන් ඉඳිතත් කොවුලන්ට බ ඳු
නද පමණින් දූනගත හැකි රිවුන් ඉ ඳු

**76** සිනිඳු, සිනිඳුවූ; අමරසවන්, අමාරස වැනිවූ; අඹරස, අඹරස; බුදිමින්, අනුභව කරමින්; නිති, නිරන්තරයෙන්; පසිඳු, ප්‍රසිඞවූ; ගෙළුයන් පෙදෙසෙහි, ගෘහොද්‍යාන ප්‍රදේශයෙහි; සරමින්, හැසිරෙමින්; කොවුලන්ට බඳු, කෝකිලයන්ට බඳුවූ; එක පැහැයෙන්, එකම වර්ණයෙන්; ඉඳිතත්, ඉඳින නමුත්; නද පමණින්, (කරණලද) නාදයෙන් පමණක්; ඉඳු, (ඒකාන්තයෙන්) ඇද නැතිව, රිවුන්, කපුටුවන්; දූනගත හැකි, දූනගත හැක්කේය.

**77** විසුවත් දුදන සහ සුදනන් රැගෙණ ස රැ
නැනවත් රජතුමෝ දෙති ඔවුනට ඉසු රැ
විසයුත් ගොර උරඟ කටැ රැඳි මිණි මහ රැ
සලසත් රුවන් කිරුළග රුවනට සොඳු රැ

**77** විසයුත්, විෂයෙන් යුක්තවූ; ගොර, භයානකවූ; උරඟ, සර්පයාගේ; කට රැඳි, බොටුවෙහි රැඳුනාවූ; මහරු, මහානඝවූ; මිණි, මාණික්‍යය; රුවන් කිරුළ,

රත්නකිරීටයාගේ; සොඳුරු, යහපත්වූ; අගරුවනට. අග්‍රශයහි රත්න බවට; සඳු සත්, පමුණුවන්ය; (එමෙන්) දුදන සහ, දුර්ජනයන් සමග; විසුවත්, වාසයකළත්; සරු, සාරවූ; සුදනත්, සත්පුරුෂයන්; රැගෙණ, හැරගෙණ; නැනවත්, ඤානවත්තවූ; රජතුමෝ, රාජොත්තමයෝ; ඔවුනට, ඒ සත්පුරුෂයන්ට; ඉසුරු, ඓශ්වර්ය්‍ය; දෙති, දෙත්ය.

78 පසන් සුදන දිමට වන බව අල ස
ලබන් නවුන් පෙර කලැ කළ පවෙහි දෙ ස
තමන් මුව විසුලුවු බව පෙණෙනු මි ස
වෙනින් කවර වරදද නිසි දපණ ප ස

78 තමන් මුව, තමන්ගේ මුහුන; විසුලුවු බව, විකාරවූ භාවය; පෙණෙනු මිස, පෙණෙන බව මිස, නිසි, සුදුසුවූ; දපණ පස, කැඩපත් පතලෙහි; වෙනින් කවර වරදද, වෙනින්කවර වැරැද්දෙක්ද; (වෙනින්) වරදක් නැත්තේමය; (එමෙන්) පසන් සුදන, ප්‍රසන්නවූ සත්පුරුෂයා; දිමට, දීම පිණිස; අලසවන බව, ආලස්‍ය වන බව; ලබන්නවුන්, ලබන්නවුන් විසින්; පෙරකලැ, පූර්වකාලයෙහි; කළ, කළාවූ; පවෙහි, පාපයෙහි; දෙස, දෝෂයවේයි.

79 කොරෙත් සුද උනුන් එළු ගවර රල ර ල
කියත් මියුරු රස බස් සැලලිහිණි කැ ල
දෙතොත් යමෙක් යදිකලිමන් දුර හැර ල
වියත් කමුත් විකුමුත් ඔහුමය නැබ ල

79 එළු ගවර, එළුවන්ද ගවරයන්ද; රල රල, සමූහයෙන් සමූහය; උනුන්, ඔවුනොවුන්; සුදකොරෙත්, යුධකෙරෙත්ය; සැලලිහිණි කැල, සැලලිහිණි පක්ෂි සමූහයෝ; මියුරු රසබස්, මධුරවූ රස වචනයන්; කියත්, කියති; (ඒ සමාන්‍ය බවක් වික්‍රමයක් නොවේයි) යමෙක්, යම් කෙනෙක්; යදි, යාචකයන්ගේ; කලිමත්, ලොභ සිතදු; රහැරල, දුරුකොට හැරලා; දෙතොත්, දීම කරනහොත්; නැබල, මහත්වූ; වියත් කමුත්, ව්‍යක්තකමද; විකුමුත්, වික්‍රමද; ඔහුමය, ඔහු සම්බන්ධමය.

80 සපෙක් එකෙක් කැව් නසිනෝ ඔහුම ව ද
අනික් ලොවින් නොනැසෙයි එකම සතෙකු ද
පසක් දුදන පබුකලවුව ලංකල ද
වගක් නසීසි එමතුද වැනසෙයි ඔහු ද

80 සපෙක්, සර්පයෙකු විසින්; එකෙක්, එක් සත්වයෙකු; කැව්, දෂ්ටකළහොත්; නසිනේ, නසින්නේ; ඔහුමවද, ඔහුමමේය; ලොවින්, ලොකයෙන්; අනික් එකම සතෙකුද, අන් එක් සත්වයෙකුත්; නොනැසෙයි, නොනසියි; පසක්, ප්‍රත්‍යක්ෂයෙන්;

දුදන, දුර්ජනයා; පබුකළුවුව, ප්‍රභූනකළේවිනම්ද; ලංකළද, ලංකළේවිනම්ද; වගක්, වගීනක්; නයිසි, නැසෙයි; එමතුද, එපමණක්ද නොව; ඔහුද, ඒ දුර්ජන නැනැත්තේද; වැනසෙයි, විනාශවෙයි.

81 නොමින් ලොවැ සියලු දේ දකිනා ඇස ට
තමන් සැරි මදක්වත් නොපෙණෙන ලෙස ට
අනුන් දෙස දකිති අනුවන දන කප ට
එමෙන් සියලු ගුණ නොදනිති නියම කො ට

81 නොමින්, ප්‍රමාණයක් නැතුව; ලොවැ, ලොකයෙහි; සියලුදේ, සියලුම දෙය; දකින, දකින්නාවූ; ඇසට, නෙත්‍රයට; තමන් සැරි, තමන්ගේ සැරිය; මදක් වත්, ස්වල්පයක්වත්; නොපෙණෙනලෙසට, නොපෙණෙන්නාක්මෙන්; අනුවන, අඥානවූ; කපට දන, වංචාකාර ජනයෝ; අනුන් දෙස, අනුන්ගේ දෙස; දකිති, දකිත්ය; එමෙන්, එපරිද්දෙන්; සියලු ගුණ, ගුණ සියල්ල; නියමකොට, නියමවූ පරිද්දෙන්; නොදනිති, නොදනිත්ය·

82 සසලය තරිඳු හිම රැසවෙයි හිම ගිරි ඳු
කරඔය මුහුදු දිළිඳුව ඇවිදියි කිවි ඳු
නිසිදෙය මෙබඳු උවදුරු දූරුවේය රු දු
මෙදිය ත පසිඳු අප වගමය සුපිරිසි දු

82 තරිඳු, චන්ද්‍රතෙම; සසලය, සසලපය ඇත්තේ වෙයි; හිම ගිරිඳු, හිමාල පර්වතරාජ තෙම; හිම රැසවෙයි, පිනි රශ්මි ඇත්තේවෙයි; මුහුදු, සමුද්‍රයතෙම; කරඔය, කරදිය ඇත්තේවෙයි; කිවිඳු, කවීන්ද්‍රතෙම; දිළිඳුවැ, දරිද්‍රව; ඇවිදියි, ඇවිදීය; නිසිදෙය, සුදුසුවූදෙය; මෙබඳු, මේ ආකාරවූ; රුදු, මහත්වූ; උවදුරු, උපද්‍රව; දූරුවේය, දූරිමකළේය; මෙදියත, මේ ලොකයෙහි; සුපිරිසිදු, අතිශයින් පිරිසිදු වූයේ; පසිඳු, ප්‍රසිද්ධවූ; අපවගමය, නිර්වාණයමයි.

83 මැදහත් සුදනන්ගෙ විතරණ ගුණැති සො ද
මදවත් වූව ගණිති ළිඳැ දියමෙන් පැහැ ද
නොපණත් ගුණැති දුදනන්ගේ දන නොම ද
නොගණිත් යදි දනෝ කරදිය මෙන් මුහු දැ

83 සොඳ, යහපත්වූ; විතරණ ගුණැති, ත්‍යාගි ගුණ ඇත්තාවූ; මැදහත්, මැදහත්වූ; සුදනන්ගේ, සත්පුරුෂයන්ගේ; මදවත්වූව, ස්වල්ප වස්තුවවි නමුත්; ළිඳැ, ළිඳෙහි; දියමෙන්, ජලයමෙන්; පැහැද, ප්‍රසන්නව; ගණිති, (යාචකයෝ) ගණිත්ය; නොපණත් ගුණැති, පණතලෙස නොපවත්නා ස්වභාව ඇත්තාවූ; දුදනන්ගේ, දුර්ජනයන්ගේ; නොමද දන, බොහෝවූ වස්තුව; මුහුද, සමුද්‍රයෙහි; කරදිය මෙන් ලවණ ජලයමෙන්; යදි දනෝ, යාචක ජනයෝ; නොගණිත්, නොගණිත්ය.

84 දි ගු න් සුදුකරණ සඳ අමරැසින් යු ත
ස ස න් නොහරිණෙවු කප්හිම් තමන් ග ත
අ නු න් දුකට සුදනෝ නෙක තැන් කර ත
ත ම න් ගෙ කටයුතුවට එලෙස නොම වෙ ත

84 දිගුන්, දිසාවන්; සුදුකරණ, සුදුපැහැකරන්නාවූ; අමරැසින්යුත්, අමෘත රශ්මියෙන් යුක්තවූ; සඳ, චන්ද්‍රයා; තමන් ගත, තමන්ගේ ශරීරයෙහි; සසන්, සස ලපය; කප්හිම්. කල්පසීමාව් දක්වා; නොහරිණෙවූ, නොහරින්නාක්මෙන්; අනුන්; අන්‍යයන්ගේ; දුකට, දුඃඛයට; සුදනෝ, සත්පුරුෂයෝ; නෙකතැන්, අනේකොත් සාහය; කරත, කරත්ය; තමන්ගේ කටයුතුවට, තමන්ගේ කෘත්‍යය පිණිස; එලෙස, එසේ; නොමුවෙත, නොමවෙති.

85 ව න ත් නොයෙක් ගංහෝ ඇල කඳුරු පැ න
ම හ ත් ගැඹර සිඳුනොයනෙව් වෙරල පැ න
ල ද ත් මෙමුළු දඹදිවැ රජසිරි සුද න
සි රි ත් ලෙසට පවතී උඩඟු නොවම් න

85 නොයෙක්, අනේකවූ; ගං, ගඞ්ගාවන්හිද; හෝ, ඔයවල්හිද; ඇල, ඇලවල් හිද; කඳුරු, කඳුරැලිවලද; පැන, ජලය; වනත්, පැමුණුන නමුත්; මහත්, මහත්වූ; ගැඹර, ගාම්භීරවූ; සිඳු, සමුද්‍රය; වෙරල පැන, වෙරල ඉක්ම; නොයනෙව්, නොයන්නාක්මෙන්; සුදන, සත්පුරුෂතෙම; මෙමුළු දඹදිවැ, මේ සියලු ජම්බුද්වීපයෙහි; රජසිරි, රාජ්‍යශ්‍රීය; ලදත්, ලදුවත්; උඩඟු නොවම්න, උඩඟු නොවමින්; සිරිත් ලෙසට, චාරිත්‍රලෙසට; පවතී, පවතිය.

86 පැනසර නොවන සත නිති සුදනන් පැහැ ර
කරදර දුදන සමගවැ වෙසෙති හැමව ර
මන හර ගජකුඹින් මුත් දිමුතු මුතුහැ ර
උර සර සන ඔනිද බිජු වැනි වැසි සබ ර

86 පැනසර නොවන, ප්‍රඥාසාර නොවන්නාවූ; සත, සත්වයෝ; නිති, නිරන්තර යෙන්; සුදනන්, සත්පුරුෂයන්; පැහැර, අත්හැර; කරදර, ක්‍රූරධාරීවූ; දුදන. සම ගවැ, දුර්ජනයන් හා එක්ව; හැමවර, හැමකල්හි; වෙසෙති, වාසය කෙරෙත්ය; (ඒ කෙසේද) මනහර, මනොහරවූ; ගජකුඹින්, හස්තිකුම්භයෙන්; මුත්, මුක්තවූ; (ගැලවී වැටුනාවූ) දිමුතු, දීප්තිමත්වූ; මුතු, මුක්තාවන්; හැර, අත්හැර; සබර වැසි, වැද්දන් විසින්; ඔනිද බිජු, ඔනිද ඇටවලින්; උර, උරඃස්ථලය; සරසන වැනි, සරසන්නාක්මෙනි.

87 සොඳුරු ගුණ නුවන යුතු උතුමෝ පත ර
න පුරු දුදන සහ එක්වුව වෙති අස ර
රු දු රු කවු පහණ නැති සමතල හස ර
අ දු රු සමග වූ කලැ වේය බියක ර

87 රුදුරු, රෞද්‍රවූ; කටු පහණ, කණ්ටකපාෂාණයන්; (කටු හා ගල්) නැති, නැත්තාවූ; සමතල, සමතලාවූ; හසර, මාර්ගය; අඳුරු සමගවූ කලැ, අන්ධකාරය හා එක්වූ කල්හි; බියකරවිය, භයංකාරවේද; (එමෙන්) පතර, මහත්වූ; සොඳුරු, සහපත්වූ; ගුණ නුවන, ගුණයෙන් හා ඥානයෙන්; යුතු, යුක්තවූ; උතුමෝ, උත්තමයෝ; තපුරු දුදන සහ, තපුරු දුර්ජනයන් හා; එක්වුව, එකතුවූ කල්හි; අසර වෙති; අසාරවෙති.

88 නි ර ස ර ගුණැති සුදනෝ පර වැඩ නැති ද
වර සු ර පුරෙහි වත් නොවසති නිරය ලෙ ද
ඝොරතර නිරෙහි වත් ඔවුනට වැඩ ඇති ද
සු ර පු ර ලෙසට හැසිරෙත් සුදනෝ පබ ද

88 නිරසර ගුණැති, ස්ථිරසාර ගුණ ඇත්තාවූ; සුදනෝ, සත්පුරුෂයෝ; පර වැඩ, පරහිතවෘද්ධියක්; නැතිද, නැතහොත්; වර, උතුම්වූ; සුරපුරෙහිවත්, දිව්‍යපුරයෙහි නමුත්; නිරයලෙද, නරකයෙහි මෙන්; නොවසති, වාසය නොකෙරත්ය; ඔවුනට, ඒ අන්‍ය සත්ත්වයන්ට; වැඩ ඇතිද, වෘද්ධි ඇතහොත්; ඝොරතර, ඝොරතරවූ; නිරයෙහිවත්, නරකයෙහි නමුත්; සුරපුරලෙසට, දිව්‍යපුරයෙහි මෙන්; පබද, ප්‍රසිද්ධවූ; සුදනෝ, සත්පුරුෂයෝ; හැසිරෙත්, සංචාරණ කෙරෙති.

89 ප හ නි න් පහන් සිය ගණනක් ඇවුළුව ද
ඒ ප හ න් සිලෙහි අළු අඩු නොවැ දිලෙන ලෙ ද
ලොවැඅන් සතුන් ගුණ පළකරමින් නිබ ද
සු ප ස න් ගුණෙන්වැජඹෙති සුදනෝ පබ ද

89 පහනින්, ප්‍රදීපයෙන්; (පානෙන්) පහන් සියගණනක්, ප්‍රදීප ශතසංඛ්‍යාවක්; ඇවුළුවද, ඇවුළුවත්; එපහන් සිලෙහි, ඒ පාත්දල්ලෙහි; අළු, ආලෝකය; අඩු නොවැ, අඩු නොවී; දිලෙනලෙද, දිලිහෙන්නාක්මෙන්; නිබද, නිරන්තරයෙන්; ලොවැ, ලෝකයෙහි; අන්සතුන්, අන්‍ය සත්ත්වයන්ගේ; ගුණ, ගුණය; පළකරමින්, ප්‍රකාශ කරමින්; සුපසන් ගුණෙන්, ඉතා ප්‍රසන්න ගුණයෙන්; පබද, ප්‍රසිද්ධවූ; සුදනෝ, සත්පුරුෂයෝ; වැජඹෙති, විජෘම්භිතවෙති.

90 ග ජ කු ම් බිඳින එකසර කෙසරිඳු බලැ ති
කොතර ම් සාවුවත් තණ කබල නුබුදි ති
වි හි ගු ම් කුලෙන් යුතු උතුමෝ අබිමනැ ති
දි වි හි ම් කොටත් නොතරම් කම් නොමකෙරෙ ති

90 ගජකුම්, හස්තිකුම්භය; බිඳින, භේදනය කරන්නාවූ; එකසර, එකචාරීවූ; (තනිකර හැසිරෙන්නාවූ) බලැති, බලඇත්තාවූ; කෙසරිඳු, සිංහ රාජයෝ; කොතරම්, කොතෙක් ප්‍රමාණ; සාවුවත්, ක්ෂුධාවූවත්; (බඩගිනිවූවත්) තණකබල, තෘණභෝජනය; (තණ කොල ආහාරය) නුබුදී, අනුභවනොකරත්ය; (එමෙන්) විහිගුම් කුලෙන්, මහත් කුලයෙන්; යුතු, යුක්තවූ; අබිමනැති, අභිමාන ඇත්තාවූ;

උතුමෝ, උත්තමයෝ; දිවිහිමි කොටත්, ජීවිතය කෙළවර කොටද; නොතරම් කම්, නුසුදුසු කම්; නොම කෙරෙති, නොම කෙරෙත්ය.

91 බ ල යු ත් තුමුල මතවරනිඳු මෙදෙනැ වි ස
දි ව න ත් සෙද තමන් සොඬ නොමඩින විල ස
ල ද ව න් නැණැති දන මුළු ලොවැ ඉසුරු රැ ස
නොපණත් දෙයක් නොකරති නිසි දේම මි ස

91 තුමුල, මහත්වූ; බලයුත්, බලයෙන් යුක්තවූ; මතවරනිඳු, මත්තහස්තිරාජයා; මෙදෙනැවිස, මදයෙන් ඇවිස්සී; සෙද, සීඝ්‍රයෙන්; දිවනත්, ධාවනයකරනත්; තමන් සොඬ, තමන්ගේ සොඬ; නොමඩින විලස, ආක්‍රමණය නොකරන්නාක් මෙන්; (නොපාගන්නාක්මෙන්) නැණැති දන, ඥානවන්ත ජනයෝ, මුළුලොවැ, සියලුලෝකයෙහි; ඉසුරු රැස, ඓශ්වර්‍ය්‍යරාශිය; ලදුවත්, ලදනුමුත්; නිසිදේම මිස, යෝග්‍යදේම මිස; නොපණත් දෙයක්, නොපණත්වූ දෙයක්; (හෙවත් පණතට විරුඬවූ දෙයක්) නොකරති, නොකෙරෙත්ය.

92 ප ස ක් මුනිඳු සමයම නොගෙණැ සුනිම ල
අ නි ක් කුදිටු ගෙණැ ලෙව්සත නැණ විකා ල
එමොක් පුරට පැමිනෙත යම් කල එක ල
අදෙ ක් දුක්ක හෙයි වී පදය නුබ ත ල

92 පසක්, ප්‍රත්‍යක්ෂවූ; මුනිඳු, මුනීන්ද්‍රයාගේ; සුනිමල, ඉතා නිර්මලවූ; සමයම, ආගම; නොගෙණැ, ග්‍රහණය නොකොට; ලෙව්සත, ලෝක සත්වයා; නැණ විකල, ඥාන විකලයෙන්; අනික් කුදිටු, අනික් මිථ්‍යාදෘෂ්ටි; ගෙණැ, ග්‍රහණයකොට; එමොක්පුරට, ඒ මෝක්ෂ පුරයට; යම්කලැ, යම් කාලයෙක්හි; පැමිනෙති, පැමිණෙනහොත්; එකල, ඒ කල්හී; අදෙක්, අන්ධයෙක්; නුබතල, ආකාශතලයෙහි; විපදය, පක්ෂිපාදය; (කුරුළු අඩිය) දුක්කහෙයි, දර්ශනය කලහැකිවෙයි.

93 න ද න ගුණ නුවණ යුතු උතුමෝ මහ ත
නොගෙණ කිසි කරුණු සත සුවපත් කර ත
දි ලෙ න සාමඬුළු යුතු තුරුපෙල දිමු ත
ය ෙන න සත සතපමින් ගිම් දුර හරි ත

93 දිලෙන, දිලිසෙන්නාවූ; සාමඬුලුයුතු, සාඛාමණ්ඩලයෙන් යුක්තවූ; දිමුත දීප්තිමත්වූ; තුරුපෙල, වෘක්ෂපන්ති; යනෙන සත, යන එන්නාවූ සත්වයා; සත පමින්, සතප්පමින්; ගිම්, ග්‍රීෂ්මය; දුරහරින, දුරහරින්ය; (එමෙන්) නදන, සතුටු එලවන්නාවූ; ගුණ නුවණ යුතු, ගුණයෙන් හා ඥානයෙන් යුක්තවූ; මහත, මහත් වූ; උතුමෝ, උත්තමයෝ; කිස්කරුණු, කිසිකාරණයක්; (කිසි දෙයක්) නොගෙණ, ග්‍රහණය නොකොට; සත, සත්වයා; සුවපත්කරත, සැපතට පමුනුවති.

94 ඉ සු රෙ න් රුවින් සරි අය වෙසෙතත් නොම ද
කුළු ණෙ න් ලොව රකිනු එක් උතුමෙකු පබ ද
මැ ඩි ය න් බුදින නාකැල ඇතිවද විස ද
ද ර මි න් දෙරණ සිපිනේ නතනාමව ද

94 මැඩියන්, මන්ඩුකයන්; බුදින, අනුභවකරන්නාවූ; විසද, බොහෝ විසඇත්තාවූ; නාකැල, නාගසමූහයා; ඇතිවද, ඇතිනමුත්; දෙරණ, ධරනීය; දරමින්, ධාරණයකරමින්; සිපිනේ, සිප්නතේ; නතනාමවද, අනන්තනාමවෙයි; (එමෙන්) ඉසුරෙන්, ඓශ්වර්‍යයෙන්ද; රුවින්, රූපයෙන්ද; සරි අය, සමාන අය; නොමද, බොහෝසේ; වෙසෙතත්, වාසයකරතත්; ලොව, ලෝකය; කුළුණෙන්, කරුණාවෙන්; රකිනු, රක්‍ෂාකරණු පිණිස; පබද, ප්‍රසිද්ධවූ; එක් උතුමෙකි, එක් උත්තමයෙක් වෙයි.

95 තැන තැන නිදන් කොට නොතබා හැම දින ම
කව බොව යදි න් හට දන්දෙව වඩා පෙ ම
මි හි බැඳි කි ගු න් හට වනලෙස දූක දූක ම
තව තව ලොබින් දන රැස්කොව තබනු කි ම

95 තැන තැන, තැනින් තැන; නිදන්කොට, නිධානකොට; නොතබා, තැබීම නොකොට; හැමදින, හැමදවස්හිම; කව බොව, අනුභවකරව පානයකරව; පෙම වඩා, ප්‍රෙම වර්ධනයකොට; යදින් හට, යාචකයන්ට; දන්දෙව, දානයදෙව; මිහි බැඳි, මි බැන්දවූ; බිඟුන් හට, භෘංගයන්ට; වනලෙස, වන්නාවූ විලාසය; දූක දූකම, දක්නයකොටකොටම; තව තව ලොබින්, තව තව ලොභයෙන්; දන, ධනය; රැස්කොට, රාශිකොට; තබනු, තැබීම; කිම, කිමෙක්ද.

96 නිති න් දුදන සමගවැ සුදන විසුව ද
ප ස න් ගුණෙන් ලොවැ සතහට වෙති සුභ ද
රි වු න් විමන ඇතිවුනු කොවුලන්ගෙ න ද
අ ස න් නවුන් යුග සවණට මිහිරි ව ද

96 රිවුන්, කපුටුවන්ගේ; විමන, විමන්හි; ඇතිවුනු, වැඩුනාවූ; කොවුලන්ගේ, කොකිලයන්ගේ; නද, නාදය; අසන්නවුන්, අසන්නවුන්ගේ; යුගසවණට, ශ්‍රවණයුග්මයට; මිහිරිවද, මධුරවෙයි; (එමෙන්) නිතින්, නිරන්තරයෙන්; දුදන සමගවැ, දුර්ජනයන්හා එක්ව; සුදන, සත්පුරුෂයෝ; විසුවද, වාසයකලත්; පසන් ගුණෙන්, ප්‍රසන්න ගුණයෙන්; ලොවැ, ලෝකයෙහි; සතහට, සත්වයාට; සුභද වෙති, සුභදවෙත්ය; හෙවත් යහපත් සිත් ඇත්තාහුවෙති.

97 නො මි න් මහ පිනැතියෙක් පසිදු මෙදිය ත
කු ලෙ න් අඩුවැ උපයත් ලොව නැණැති ස ත
තො සි න් අදර බුහුමන් වඩමින් පුද ත
ම ඩි න් උපන් ඉදුවර පලදිනෙව් ම ත

97 මෙදියත, මේ ලෝකයෙහි; නොමින්, බොහෝසෙයින්; පසිදු, ප්‍රසිද්ධවූ; මහ පිනැතියෙක්, මහත් පුණ්‍යවන්තයෙක්; කුලෙන්, ගෝත්‍රයෙන්; අඩුව, අඩුවි; උපනත්, උපන් නමුත්; ලොව, ලෝකයෙහි; නැණැති, ඥානවන්තවූ; සත, සත්වයෝ; තොසින්, තෝෂයෙන්; අදර බුහුමන්, ආදර බහුමාන; වඩවමින්, වර්ධනය කරමින්; පුදත, පූජාකෙරෙත්ය; මඩින්, මඬෙන්; උපන්, උපන්නාවූ; ඉදුවර, ඉන්දීවර; (මානෙල් මල්) මත, මස්තකයෙහි; පලඳිනෙව, පලඳින්නාක්මෙනි.

| | | |
|---|---|---|
| 98 බු දි ත් | මිහිරි මී අඹ රසය සතොසි | න |
| ඉ දි ත් | සොඳුරු ගෙ උයන් වල තුරු මුදු | න |
| සි රි ත් | මෙ ඈ කරතත් කොවුලන් ලෙසි | න |
| ව ස ත් | කලැ දූනෙසි රිවු පරපුටු නදි | න |

98 මිහිරි, මධුරවූ; මී අඹ රසය, මධුරාම්‍ර රසය; සතොසින, සන්තෝෂයෙන්; බුදිත්, අනුභවකෙරෙත්ය; සොඳුරු, සුන්දරවූ; ගෙ උයන්වල, ගෘහෝද්‍යානයන්හී; තුරු මුදුන, වෘක්ෂමස්තකයෙහි; ඉදිත්, ඉඳිත්ය; මෙඇ, මේ ආද්‍යවූ; සිරිත්, චාරිත්‍ර; කොවුලන් ලෙසින්, කෝකිලයන් මෙන්; කරතත්, කරණ නමුත්, නදින, නාදය කරණකොටගෙණ; රිවු පරපුටු, කපුටුවන්ද කෝකිලයන්ද; (යන මොවුන්ගේ වෙනස) වසන්කලැ, වසන්තකාලයෙහි; (බස් වෙසක් දෙමයෙහි) දූනෙයි, ජානනයවෙයි.

| | | |
|---|---|---|
| 99 නෙක ර ජ | සිරින් සුරිඳුට සිය ගුණෙන් වැ | ඩී |
| රූ පු ර ජ | ගජන් එකසර කෙසර ලෙස මැ | ඩී |
| දි න ර ජ | කුල පහගැ බැඳි මහගු රන් කො | ඩී |
| සි රි ර ජ | සිහ රජුගෙ සිරිපද සෙවන වැ | ඩී |

99 නෙක, අනේකවූ; රජසිරින්, රාජශ්‍රියෙන්; සුරිඳුට, සුරේන්ද්‍රයාට; සිය ගුණෙන්, සියක් ගුණයෙන්; වැඩි, වැඩිවූ; එකසර, එකචාරීවූ; කෙසරලෙස, සිංහයෙක් මෙන්; රූපුරජ, සතුරු රජනැමති; ගජන්, හස්තීන්; මැඩි, මර්දනකළාවූ; දිනරජ කුල, සූර්‍ය්‍යවංශ නමැති; පහගැ, ප්‍රාසාදශ්‍රයෙහි; බැඳී, බඳිනාලද; මහගු, මහාර්ඝවූ; රන්කොඩි, රත්රන් කොඩියක් වැනිවූ; සිරි රජසිහ රජුගෙ, ශ්‍රී රාජසිංහ රජයාගේ; සිරිපද සෙවන, ශ්‍රීපාදච්ඡායාවෙහි; වැඩි, වැඩුනාවූ.

| | | |
|---|---|---|
| 100 වි ජ ම් | පෙල සයුර සැදි මොක් වෙරලැති | න |
| සි යු ම් | නියතලෙන් ගත් කුඹු යොත් සිරි | න |
| උ තු ම් | හිස් වැල්ල නම් ගම හිම් සොබ | න |
| ද හ ම් | දජ නමැති පඬිවර හට නද | න |

100 මොක්, මෝක්ෂ නමැති; වෙරලැතින, වෙරළින්; සැදි, සැදුනාවූ; විජම්පෙල, අභිධර්ම පාලි නමැති; සයුර, සාගරය; සියුම්, සූක්ෂමවූ; නියතලෙන්, (නී අතලෙන්) ඥාන නමැති හසන තලයෙන්; කුඹු යොත් සිරින, කුම්භයෝනියා මෙන්; (හෙවත් විඥප්තිව ගුරුවූ අගස්ති රුසියාමෙන්) ගත්, ග්‍රහණය කළාවූ; උතුම්, උත්තමවූ;

හිස්වැල්ල නම් ගම, හිස්වැල්ල නම් ග්‍රාමයට; සිත්, සතාම්වූ; හෙවත් අධිපතිවූ; සොබන, සහපත්වූ; දහම් දජ නමැති, ධර්මධ්වජ යන නාමයක් ඇත්තාවූ; පඩිවර හට, පණ්ඩිතොත්තමයා හට; තදන, පුතුවූ.

101 නිති සුප ස න් න  සරසවි රැඳි මුව තඹ  ර
කිවි ගජ බි න් න  කල එකසර කෙසර යු  ර
අල ගිය ව න් න  මුකවෙටි නමැති කිවිය  ර
යුතු පද ස න් න  මේ කවි කලෙය අමයු  ර

101 සුපසන්න, ඉතා ප්‍රසන්නවූ; මුවතඹර, මුඛ නමැති තාම්‍ර රත්‍නයෙහි; නිති, නිරන්තරයෙන්; සරසවි, සරස්වතිය; රැඳි, රැඳුනාවූ; කිවිගජ, කවීන් නමැති හස්තිහ්; බින්නකල, භග්න කලාවූ; එකසර, එකචාරීවූ; කෙසරයුර, සිංහයෙකු වැනිවූ; අලගියවන්න මුකවෙටි නමැති, අලගියවන්න මුකවෙටි යන නාමයක් ඇත්තාවූ: කිවිසර, කාව්‍යකාරක තෙම; පදසන්න, පදසන්නයෙන්; හෙවත් පුරාණාචාර්‍ය්‍ය කියමන්වල සන්නවිලාසයෙන්; යුතු, යුක්තවූ; අමයුර, අමෘතාකාරවූ; මේ කවි, මේ කාව්‍යය; කලෙය, කෙළේයි—නිමි.

# දිනකරප්‍රකාශය.

වික්ටෝරියා රාජාධිරාජිනීන්වහන්සේ විසින් ශ්‍රී කරුණා මකී මතාවයෙන් පිළිගනු ලැබුවාවූද, කොළඹ මහා ප්‍රදර්ශනයේදී රන් රන් පදක්කමක් ලැබුවාවූද, ආණ්ඩුකාර උතුමානන්වහන්සේලාගෙන් සහ පත්‍ර කර්තෘවරයන්ගෙන්ද නොයෙක්වර පැසසුම් ලැබුවාවූද නිකායභෙද දෘෂ්ටිභෙදාදිය භජනය නොකර සතියකට හතර වරක් පලකරණ එකම සිංහල පත්‍රයවූ මෙම **දිනකරප්‍රකාශ පත්‍රයේ** ආණ්ඩුවේ ප්‍රධාන දෙපාර්තමේන්තුවලද කොළඹ නාගරික සභාවේ සහ **මහජනයා**ගේත් දැන්වීම් ප්‍රධාන කොටම ප්‍රසිඬවෙන බැවින් දැන්වීම්පත්‍ර ප්‍රසිඬ කිරීමට සිංහල පත්‍ර අතුරෙන් සියල්ලටම වඩා **සුදුසු පත්‍රය** මෙය බැව් මනාසේ ඔප්පුවේ.

ඉතා අලුත් විදුලි ප්‍රවෘත්තිද, වෙළඳ ප්‍රවෘත්තිද, ව්‍යවස්ථායක මන්ත්‍රිසභාවේ කෙරෙණ වාද විවාදාදියද, මෙරට පිටරට ආරංචි සහ **වැදගත්** කර්තෘ වාක්‍යයන්ද කියවන්ට කැමති සියලු මහත්වරුන් **මීට දායකවියයුතුයි**.

අවුරුද්දකට දායක මුදල් රුපියල් 5 යි. තැපැල් වියදම රුපියල් 1 යි. සතියකට දෙවරක් ගෙන්නවා ගන්නවා නම් රුපියල් 2 යි. තුන්වරක් නම් රුපියල් 3 යි. හතරවරක් නම් රුපියල් 4 යි.

---

ගරු. ජේම්ස් ද අල්විස් තුමාණන්ගේ

**ජීවිතකථාව.**

ගරු. ජේම්ස්ද අල්විස් අද්වකාද් තුමාගේ ජීවිත කථාව සහ එතුමා ඒය මිත්‍රයක් සමග කලින් කල ලියා කියාගත් කාව්‍යාදිය අප්‍රකාශිත මෙම මා හැකි පොත දැනට අච්චුගස්වා විකිනීමට තිබේ.

එතුමාගේ ඡායාරූපයක්ද, කවිසිලෝ 350 ක්ද මෙහි අන්තර්ගත බව සැලකිය යුතුයි.

කොළඹ පිටකොටුවේ හතරවෙනි හරස් වීදියේ දිනකර ප්‍රකාශ අච්චුකන්තෝරුවෙන් සහ සියලුම පොත් වෙළෙන්දන්ගෙන්ද මේපොත ලබාගන්ට පුළුවන.

පොතක මිල ශත 50. තැපැල් වියදම ශත 2, මොනිඔඩර් පෝස්ටල් ඕඩර් මිස තැපැල් මුද්දර බාරගනු නොලැබේ. වැලිපුණ්ණපේබල් මාර්ගයෙන් එවිය නොහැකිය.



